# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2253/28 - 2021 නොවැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2021.11.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM//05/B/2014/75. ආරවුල් අංකය : A/18/2017. සහ

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.06.16 දිනැති හා අංක 2023/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.06.09 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මතුගම, හිරිකැටිය, නැබඩ පාර, එම්. ඒ. ජයන්ත මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.07.08 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 අගෝස්තු මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය.

එම්. ඒ. ජයන්ත මයා,
නැබඩ පාර,
හිරිකැටිය,
මතුගම.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො. 200, කරුළ පාර,
කොළඹ 05.
අතර වූ කාර්මික ආරාවුල.

ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත නම් සඳහන් පාර්ශ්වකරුවන් අතර වූ කාර්මික ආරාවුල නිරවුල් කිරීමෙන් බේරුම් කිරීම සඳහා 2017.06.09 වැනි දින මා වෙත යොමු කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් IR/COM//05/B 2014/75 අංකය යටතේ ගොනුකර ඇති ලේඛනය අනුව ඉහත නම් සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වන්නේ,

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මතුගම ඩිපෝවේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කළ එම්. ඒ. ජයන්ත මහතාට පෞද්ගලික අවශ්‍යතාවයක් නිසා ඔහු ඉල්ලා සිටි දිනෙක


1 A – G 35318 — 31 (2021/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

නිවාඩුව ලබා නොදී ඔහුට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා ශ්‍රී ලංගම/හො/පා/71/2013 හා 2013.05.08 දිනැති අභියාචනා නියෝගය අනුව ඉල්ලුම්කරුගේ සේවය 2012.08.31 සිට 2012.12.29 දින දක්වා තහනම් කළ කාලයට හිඟ වැටුප් නොගෙවීම හා 2013.05.09 සිට 2013.06.08 දින දක්වා මා 01ක් සේවය තාවකාලිකව අත්හිටුවීම හා හොරණ ඩිපෝවට ස්ථාන මාරු කිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමි සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

ඉල්ලුම්කරු විසින් 2017.07.10 දින ගොනු කර ඇති සවිස්තර වාර්තාවේ සඳහන් කර ඇත්තේ 2012.08.17 වැනි දින අලුයම 5.45ට සේවයට වාර්තා කිරීමට තිබුණ ද එදින පැවති වර්ෂාව හේතු කොට ගෙන නිවසේ කොටසකට ගසක් කඩා වැටුණ බවත්, ඒ නිසා නිවාඩු ලබා ගනීම සඳහා සේවා ස්ථානයට ගිය බවත්, යෙදවුම් නිලධාරී විසින් නිවාඩු ලබාදීම ප්‍රතික්ෂේප කර ධාඃ89 කාඃඅ. 177 සේවාවේ යෙදවූ බවය. ඉල්ලුම්කරු තම සේවයේ නොයෙදී ඩිපෝවෙන් බැහැරට ගොස් එදිනට නිවාඩු ඉල්ලා විදුලි පුවතක් යැවූ බවත් ය.

එසේ වුවද පාලන අධිකාරිය තමාගේ වැඩ තහනම් කර සේවය ප්‍රතික්ෂේප කිරීමේ පදනම මත විනය පරීක්ෂණයක් පවත්වා දඬුවම් ලබා දීමෙන් තමාට අසාධාරණයක් සිදු වී ඇති බවය. එසේම ඉල්ලුම්කරු එහි වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ සේවයට වාර්තා කොට අත්සන් කිරීමෙන් පසු සේවය ප්‍රතික්ෂේප කිරීම ලංගම විනය ව්‍යවස්ථා මාලාව අනුව වරදක් වුවත් තමා එදින සේවයට වාර්තා කර අත්සන් කර නොමැති නිසා තමන්ට දඬුවම් ලබා දීමෙන් ආසාධාරණයක් සිදු වී ඇති බවය.

දෙවන පාර්ශ්වය 2017.07.17 ගොනු කර ඇති විස්තර ප්‍රකාශය මගින් මෙම කරුණ පිළිබඳව එම පාර්ශ්වයේ ස්ථාවරය දක්වා ඇත. ඒ අනුව 2012.08.17 දින පෙ. ව. 6.45 කොන්දොස්තර සේවය සඳහා ඩිපෝවට පැමිණීමෙන් පසු යෙදවීම් නිලධාරි තැන විසින් ධා. 89 හා 177 සේවයට යෙදීමෙන් අනතුරුව එම කාර්ය ප්‍රතික්ෂේප කිරීමෙන් ඉල්ලුම්කරු විෂමාචාරයක් සිදුකර ඇති බවය. ඒ නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස 2 වන පාර්ශ්වය ඉල්ලා ඇත.

දෙපාර්ශ්වය විස්තර ප්‍රකාර ඉදිරිපත් කිරීමෙන් පසු මෙම කරුණ බේරුම් කිරීමෙන් නිරාකරණය කිරීමට හැකියාවක් ඇත්ද යන්න සළකා බැලීම සඳහා 2017.12.19 දින කැඳවන ලදී. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ ආර්. ජේ. එම්. ආනන්දප්පා මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නීතිඥ චන්ද්‍රවංශ මහත්මිය ද පෙනී සිටි අතර මෙම ආරාවුල බේරුම් කිරීමට හැකි තත්වයකුත් නොතිබුණ නිසා ඉල්ලුම්කරුගේ සාක්ෂි ලබා ගැනීමට තීරණය කළෙමි.

ඉල්ලුම්කරු 2018.02.16 දින සිට මූලික සාක්ෂිය දෙමින් ප්‍රකාශ කළේ අදාළ දිනයේ තමාට සේවයේ යෙදෙන ලෙස ප්‍රකාශ කළත් එසේ නොකර ඩිපෝවෙන් පිටව ගිය බවය. එසේ පිටව ගොස් තැපැල් කාර්යාලයට ගොස් එදිනට නිවාඩු ඉල්ලා විදුලි පුවතක් එවූ බව ඔහු ප්‍රකාශ කළේය. එකී විදුලි පුවතට අදාළ ලදුපත විනය පරීක්ෂණයට ඉදිරිපත් කළ නිසා තමුන් සතුව නොමැති බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. එසේම 2012.08.30 වැනි දින සේවය තහනම් කිරීමේ ලිපිය (A1 ලෙස ලකුණු කරන ලදී) ලැබුණ බවත්, 2012.09.14 දින චෝදනා පත්‍රයක් ලැබුණ බවත් (එය A2 ලෙස ලකුණු කරන ලදී.) එහි චෝදනා 5ක් සඳහන්ව තිබුණ බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය. ඉන්පසු විනය පරීක්ෂණයක් පවත්වන බව දන්වා 2012.10.14 දාතමින් ලැබුණ බවට එම ලිපිය (A3 ලෙස ලකුණු කරන ලද) විනය පරීක්ෂණයට නියෝජිතයෙක් මගින් ඉදිරිපත් කළ කරුණු ඉදිරිපත් කළ නමුත් චෝදනාවලට වරදකරු කර 2012.12.26 දින විනය නියෝගයක් ලැබුණ බවත් (A4 ලෙස ලකුණු කරන ලද) සේවා අත්හිටුවා තිබූ කාලය වැටුප් නොමැතිව තවත් මාස සේවය අත්හිටුවීම හොරණ ඩිපෝවට මාරු කිරීම යන දඬුවම් නියම කළ බව ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ ය.

අනතුරුව ඉල්ලුම්කරු ඉදිරිපත් කළ අභියාචනයෙන් මාස 3ක දඬුවම මාස 1 දක්වා අඩුකළ බවත් සෙසු දඬුවම් වෙනස් නොකළ බවත් සාක්ෂිකරු ප්‍රකාශ කළේ ය. මේ කරුණු ගැන එකඟ නොවූ ඉල්ලුම්කරු සහනයක් පතා කම්කරු කාර්යාලයට පැමිණිලි කළ බව ප්‍රකාශ කළේය.

සේවය තහනම් කළ දිනයේ සිට මාස 5 ක සියලු දීමනා සහිත වැටුප් ලබා දෙන ලෙස ඉල්ලුම්කරු ඉල්ලා සිටියේ ය.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී.

එම හරස් ප්‍රශ්නවලදී ඉල්ලුම්කරු මෙම සිදුවීමට පෙර විවිධ වරදවල්වලට දඬුවම් ලබා තිබේද යන්න ප්‍රශ්න කළේය. එසේ දඬුවම් ලබා දීමට අදාළ ලේඛන R3, R4, R5, R6, R7, R8, R9, R10, R11, R12, R13 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර එසේ දඬුවම් ලැබුණ බව ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පිළිගන්නා ලදී.

එසේම අදාළ දිනයේ ඉල්ලුම්කරු විසින් එවන ලද විදුලි පුවත ගැන ප්‍රශ්න කළේය. එහි දී ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ විදුලි පුවතට අදාළ තැපැල් කාර්යාලයෙන් ලබාදුන් ලේඛනය විනය විභාගයේදී ඉදිරිපත් කළ බවත්, එය නැවත නොලැබුණ බවත් ය.

එදින නිවාඩු ලබා ගැනීමට ඩිපෝවට ගිය අවස්ථාව සම්බන්ධයෙන් අසන ලද ප්‍රශ්නයට ඉල්ලුම්කරු මෙසේ පිළිතුරු දුන්නේ ය.

> උ: මම ගියා නිවාඩු ලිපියක් බාර දෙන්න. ලිපිය බාර ගත්තේ නැතුව ඒ මහත්තයා මාව සේවයට යොදවන්න හැදුවා. මා කිව්වා මා කරදරයක් වෙලා ආවේ. මට සේවය කරන්න අපහසුයි කියලා. එතුමා ඒක පිළිගන්නේ නැතුව නිවාඩු ලිපියත් බාර ගන්නෙ නැතුව මට දඬුවම් පත්‍රිකාවක් ඉදිරිපත් කළා.

අනතුරුව ඉල්ලුම්කරුගෙන් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා පිළිබඳව ප්‍රශ්න කරන ලදී. එහෙත් ඉල්ලුම්කරු අදාළ දිනයේ සේවයට වාර්තා කළ බවට යෝජනා කිරීමක් හෝ ඒ බව සනාථ කරන ලේඛනයක් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

ඉල්ලුම්කරු නැවත ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් (20-18 - 05.28 සාක්ෂි සටහන් පිටුව 4)

ප්‍රඃ දැන් එතකොට සේවයට වාර්තා කළොත් තමුන් සේවය කරන්න බැඳිල ඉන්නවා ද ?

උඃ එහෙමයි ස්වාමිනී.

ප්‍රඃ එතකොට දැන් ඔච් තමුන්ගෙන් ප්‍රශ්න අහපු ආකාරයට තමුන් ඔය කියන ප්‍රශ්න ගැන සිද්ධිය දවසේ සේවයට වාර්තා කර සිටිය ද?

උඃ සේවයට වාර්තා කර සිටියේ නෑ ස්වාමිනී.

ප්‍රඃ සේවයට වාර්තාකර සිටියා නම් ?

උඃ හිටියානම් කරන්න ඕන අනිවාර්යයෙන්. (පිටුව 5)

ප්‍රඃ එතකොට සාක්ෂිකරු සේවයට වාර්තා කරනු නැති තත්වය තුළ තමුන් බැඳිල ඉන්නව ද උසස් නිලධාරියාගේ අණ පිළිපදින්න ?

උ : එහෙම පිළිගන්න බැඳිලා නෑ.

සේවයට වාර්තා කර නොමැති තත්වයක් තුළ විනය නියෝගයෙන් දඬුවම් දීමක් අසාධාරණ බවත්, ඒ නිසා මාස 5ක වේතනය අහිමි වූ බවත් ඉල්ලුම්කරු නැවත ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරුගේ සාක්ෂිය A1 සිට A5 දක්වා ලේඛන ලකුණු කරමින් අවසන් කරන ලද අතර ඉල්ලුම්කරු වෙනුවෙන් වෙනත් සාක්ෂියක් කැඳවූයේ නැත.

2019.05.10 වනි දින 2 වන පාර්ශ්වය වෙනුවෙන් ඩිපෝ මාර්ග පරීක්ෂකවරයෙකු වන ඉන්දික නවුන්තුඩුව ගමගේ නමැති අය සාක්ෂියට කැඳවන ලදී. ඔහු සාක්ෂි දෙන ලද්දේ ඉල්ලුම්කරගේ පෞද්ගලික ලිපිගොනුව ආශ්‍රයෙනි. මුලින් ඔහු මූලික ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළේ, ඉල්ලුම්කරු පරක්කුවෙලා සේවයට පැමිණි බවත්, ඩිපෝ කළමනාකාර මහතා ඔහු වෙනත් පාරක යොදවන්න හදලා තිබෙන බවත්, එය ප්‍රතික්ෂේප කරලා ඩිපෝ භූමියෙන් පිටව ගොස් ඇති බවත් ය. ඉන්පසු ඉල්ලුම්කරුගේ සේවය තාවකාලිකව තහනම් කර විනය පරීක්ෂණයක් පවත්වා සේවය මාස 3කට තහනම් කර ඇති බවත් ප්‍රකාශ කර සිටියේ ය. එසේම ඉල්ලුම්කරු හොරණ ඩිපෝවට මාරු කරන ලද බවත් ප්‍රකාශ කළේය. හොරණ ඩිපෝව රාජකාරියට යාම අපහසු ගමනක් නොවන බව ද, ප්‍රකාශ කළේය. අනතුරුව සාක්ෂිකරුට R6 ලෙස ලකුණු කරන ලද ලේඛනය පෙන්වා මීට පෙර ඉල්ලුම්කරුගේ සේවය තහනම් කර ඇති බවත්, තවත් ලේඛනයන් R14 ලෙස ලකුණු කර එහි සඳහන් ආකාරයට ඉල්ලුම් කර පඩි රහිත නිවාඩු යාමක් පිළිබඳ කරුණු ඉදිරිපත් කළේය. එසේම සාක්ෂිකරු ප්‍රකාශ කළේ ඉල්ලුම්කරුට පෙර වැරදි තිබෙන බවත්, ඒවාට සුදුසු දඬුවම් දී ඇති බවත් ය.

එම සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට දුන් පිළිතුරු මෙසේය. (පිටුව 21-22)

ප්‍ර : යම්කිසි සේවකයෙක් සේවයට වාර්තා කොට ඔහු ඒක සටහන් කරන්නේ කොතැනට ද?

උ : දායක පත්‍රය අත්සන් කර.

ප්‍ර : දායක පත්‍රය කියන්නේ මොකක් ද?

උ : දායක පත්‍රය කියන්නේ කොන්දොස්තර මහත්වරුන්ට සේවයට වර්තා කිරීමේ දී අත්සන් තැබිය යුතු ලේඛනය.

ප්‍ර : එය පැමිණිමේ ලේඛනය කීවොත් හරි ද?

උ : නිවැරදිය.

ප්‍ර : එතකොට තමුන්ට එම ලිපිගොනුව බලල කියන්න පුලුවන් ද ප්‍රශ්නගත සිද්ධිය වූ 2012.08.17 වෙනිදා මේ ඉල්ලුම්කාර එම්. ඒ. ජයන්ත මහතා සේවයට වාර්තා කරල අත්සන් කරලා තියෙන්නේ කීයට ද කියලා ?

උ : දායක වාර්තාව නෑ මේකේ.

හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් (පසුදින)

උසස් නිලධාරියාට අවනත විය යුත්තේ සේවයේ ඉන්නවා නම් විතරනේ ? දැයි අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ප්‍රකාශ කළේ එසේ නොවන බවය.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී අදාළ දිනයේ විදුලි පුවතක් යැවූ බව ප්‍රකාශ කළ ද, විදුලිපුවතක් යවන ලද බව සනාථ කරන ලේඛනයක් ඉදිරිපත් කළේ නැත.

වන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය සහිත ලේඛනය (A2) පරීක්ෂා කළෙමි. එම ලේඛනයේ පහළින් විනය විභාගය සඳහා ඉදිරිපත් කරන ලේඛන ලැයිස්තුවේ අංක 8 ලෙස සඳහන් වන්නේ,

"8. 2012.08.17 වැනි දින කොන්. මහතා විසින් සංකඃ (ධාවන) තැන වෙත එවා ඇති විදුලි පුවත යනුවෙනි."

ඒ කරුණු අනුව ද, ඉල්ලුම්කරු එදින නිවාඩු ඉල්ලා විදුලි පුවතක් ඒවා ඇති බවට සෑහීමට පත් වෙමි.

ඉල්ලුම්කරුට බාර දී ඇති චෝදනා පත්‍රයේ අංක 1 යටතේ සඳහන් වන්නේ.

"කොන්දොස්තර සේවය සඳහා ඩිපෝවට පැමිණීමෙන් පසු යෙදයුම් නිලධාරි මහතා විසින් ධ.89 කා.අ. 177 හි සේවයේ යෙදවීමෙන් පසු එම කාර්ය ප්‍රතික්ෂේප කිරීමෙන් විෂමාචාරයක් සිදු කළ බවය.

"ඩිපෝවට පැමිණීම පමණක් එදින රාජකාරියේ නිරතවන සේවකයෙක් වන්නේ ද?

සේවකයෙකු විවිධ කාර්යයන් සඳහා ඩිපෝවට පැමිණිය හැක. තමාට හිමි යම් මුදලක් ලබා ගැනීම, නිවාඩු ඉල්ලුම්පත බාර දීම, ආදී කරුණක් සඳහා එසේ පැමිණිය හැක. එසේ පැමිණි පමණින් ඔහු එදින රාජකාරියේ යෙදෙන සේවකයෙකු වන්නේ නැත. රාජකාරියේ යෙදෙන සේවකයෙකු වීමට නම් ඔහු දායක ලේඛනයේ නැත්නම් පැමිණීමේ ලේඛනයේ අත්සන් තබා තිබිය යුතුය. ඉල්ලුම්කරු එහි අත්සන් තබා රාජකාරී භාරගත් සේවකයෙකු නොව තමාට වූ කරදරයක් දැනුම් දීම සඳහා පැමිණි සේවකයෙකු බව පැහැදිළිය. ඉහළ නිළධායෙකුට එවැනි සේවකයෙකුට රාජකාරී කටයුත්තක් පැවරිය නොහැකිය. ඒ අනුව එවැනි කාර්යයක් ප්‍රතික්ෂේප කළ නිසා ඔහුට විෂමාචාර චෝදනාවක් ඉදිරිපත් කළ නොහැක.

2 වන පාර්ශ්වය විභාගයේ දී ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාව R17 වශයෙන් ද, බරපතල විෂමාචාර ක්‍රියාවන්ට අදාළ උපලේඛනය R17 (a) වශයෙන් ද ලකුණු කරන ලදී. එම ලේඛනය අංක 33 යටතේ සඳහන් වන්නේ.

33 - උසස් නිලධාරීන්ගේ නීත්‍යානුකූල නියෝගයක්, උපදේශයක් නොපිළිගැනීම හා ක්‍රියාවේ යෙදවීම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීමයි.

මේ විෂමාචාර චෝදනාව ඉදිරිපත් කළ හැක්කේ සේවයේ යෙදී සිටින සේවකයෙකු සම්බන්ධයෙනි. ඒබව ව්‍යවස්ථා මාලාවේ අර්ථ නිරූපණය (පිටුව 28) මගින්ද තහවුරු වේ. අර්ථ නිරූපන 26.4 මේසේ සඳහන් වේ.

"විෂමාචාර ක්‍රියා යනුවෙන් සඳහන් කරනුයේ සේවකයෙකු විසින් කුමන ගමනා ගමන මණ්ඩලයක හෝ සේවයේ යෙදී සිටිය දී කරනු ලබන විෂමාචාර ක්‍රියාවන්ය."

සේවකයෙකු ඩිපෝ භූමියට ඇතුලු වූ පමණින් විෂමාචාර ක්‍රියාවකට යටත් වන්නේ විෂමාචාර ක්‍රියාවන් සඳහන් ලේඛනයේ අංක 8 යටතේ ඇති අවස්ථාවක පමණි. එහි සඳහන් වන්නේ මත්පැන් ගඳ වහනය වෙමින් හෝ මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍ය පානය කිරීමෙන් හෝ පාවිච්චි කිරීමෙන් පසු රාජකාරියේ දී යෙදී සිටීම හෝ මණ්ඩලයේ භූමිභාගය තුළට ඇතුළුවීම යනුවෙනි.

ඉල්ලුම්කරු එදින මත්පැන් බී භූමි භාගය තුළට ඇතුලු වූවාය යන චෝදනාවක් ඉදිරිපත් වී නැත.

දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී ඉල්ලුම්කරු මීට පෙර කීප අවස්ථාවක දී වැරදි සිදුකර දඬුවම් ලබා ඇති බව සනාථ කිරීම සඳහා R3, R4, R5, R6, R7, R8, R9, R10, R11, R12, R13 දරන ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේ මීට පෙර දඬුවම් ලබා ඇති බව ඉල්ලුම්කරු පිළිගන්නා ලදී. එම පෙර වැරදි අදාළ කර ගත හැක්කේ ඉල්ලම්කරු මේ අවස්ථාවේ දී විෂමාචාරය පිළිබඳ වැරැද්දක් කර ඇති නම් පමණි. ඉල්ලුම්කරු විෂමාචාර පිළිබඳ වැරැද්දක් සිදුකළ බව ඔප්පු නොකර පෙර වැරදි රාශියක් ඉදිරිපත් කිරීම නිශ්ඵල කටයුත්තකි.

ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණයේ දී ඔහුට ලබා දී ඇති දඬුවම් ද නීති විරෝධී බවත්, ඒ මගින් ඉල්ලුම්කරුට බලවත් ආසාධාරණයක් සිදු වී ඇති බවත් තීරණය කරමි.

දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුට දඬුවම් ලබා දී ඇත්තේ පහත සඳහන් ආකාරයට.

- 2012.08.31 දින සිට වේතන රහිතව සේවය තහනම් කිරීම.
- විනය පරීක්ෂණයක් පවත්වා 2012.12.26 නියෝගය අනුව ඉදිරියට මාස 3ක් සේවය තාවකාලිකව අත් හිටුවීම හොරණ ඩිපෝවට ස්ථාන මාරු කිරීම.
- අභියාචනය කිරීමෙන් පසු ඉහත දඬුවම වෙනුවට (2013.06.08) දින දක්වා පසු පඩි අහිමි කරමින් සේවය අත්හිටුවීම.

මේ අනුව දෙවන පාර්ශ්වය ඉල්ලම්කරුට දීර්ඝ කාලයක් වැටුප් රහිතව සේවය අත්හිටුවා ඇත. එසේ සේවය අත්හිටුවීමට ලක්වූ කාලය මාස 10ක් පමණ වන බව 2 වන පාර්ශ්වයේ සාක්ෂිකරුවකුද සිය සාක්ෂියේ දී පිළිගත්තේ ය. ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශණයෙන් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරුගේ මාසික වැටුප වන රු. 31,400.00 ක මත මාස 10ක් සඳහා රුපියල් 314,000.00ක හිඟ වටුපක් ලබා දීමට නියෝග කරන ලෙසය. කම්කරු කොමසාරිස්වරයා 2017.03.28 දාතමින් කාර්මික අධිකරණයට යොමුකර ඇති ලේඛනයේ සඳහන් වන්නේ පැමිණිලිකරුගේ සේවය 2012.08.31 සිට 2012.12.29 දින දක්වා තහනම් කළ කාලයට හිඟ වැටුප් නොගෙවීම හා 2013.05.09 දින සිට 2013.06.08 දින දක්වා මාස 01 සේවයේ තාවකාලිකව පිහිටුවීම හා හොරණ ඩිපෝවට මාරු කිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද යන්නයි.

එම කාලය සඳහා ඉල්ලුම්කරුට දෙන ලද දඬුවම් සාධාරණ හා යුක්ති සහගත නොවන බව තීරණය කරන අතර ඒ අනුව ඉල්ලුම්කරුට මාස 5ක හිඟ වැටුපක් 31,450 x 5 = 157,000 ගෙවීමට දෙවන පාර්ශ්වයට නියම කරමි. තව ද, දෙවන පාර්ශවය අසාධාරණ අයුක්ති සහගත ලෙස ඉල්ලුම්කරුගේ සේවය අත්හිටුවීමෙන් ඔහුට සිදු වූ හානිය වෙනුවෙන් තවත් රුපියල් ලක්ෂයක මුදලක් ගෙවීමට දෙවන පාර්ශ්වයට නියම කරමි. ඒ අනුව 157,000 + 100,000 = 257,000ක මුදල මෙම ප්‍රදානය *ගැසට්* පත්‍රය පළවී මසක් ඇතුළත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ. තව ද, මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**නීතිඥ සරත් ලියනගේ,**
බේරුම්කරු.

2021 ජූලි මස 08 වැනි දින.

11-598

*මගේ අංකය* : IR/COM/05/E/2014/85.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.01.04 දිනැති හා අංක 2000/47 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.29 වැනි දින දරන නියෝග යෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම, කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (වර්තමාන ලිපිනය : දෙහිවල, නගර සභා පටුමග, අංක 10) හි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය සහ අරුග්ගම්මන, බෝගල පතල, බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.08.17 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

අන්තර් සමාගම් සේවක සංගමය,
අංක 259/9, සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම.
(සේවකයින් 87 දෙනෙකු වෙනුවෙන්)

නඩු අංකය - A/05/2017.
පැමිණිලි අංකය : IR/COM/05/E/2014/85.

සහ

බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී,
බෝගල පතල,
අරුග්ගම්මන.

අතර පවතින කාර්මික ආරවුල පිළිබඳවයි.

### ප්‍රදානය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ (1957 අංක 62 හා අංක 4/1968 අංක 39) 1968 අංක 37 දරන කාර්මික අණපනත්වල විශේෂ ප්‍රතිපාදන පනත් වලින් සංශෝධිත 4(1) වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2016.11.18 වැනි දින මා පත්කොට මා වෙත පවරා ඇත.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :**

"බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී ආයතනයේ බෝගල පතල 2014 වර්ෂයේ සිංහල අලුත් අවුරුදු නිවාඩුව වෙනුවෙන් 2014.04.12 වැනි දින සිට 2014.04.20 වැනි දින දක්වා වසා තැබීමෙන් මීට පෙර පැවති පරිචයට පරිබාහිරව යමින් සේවකයින්ගේ වාර්ෂික නිවාඩු වලින් දින 05ක් අඩු කිරීමෙන් අගතියක් සිදු වී ඇති බවට අන්තර් සමාගම් සේවක සංගමය විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න හා එලෙස යුක්ති සහගත වන්නේ නම්, මේ සමග අමුණා ඇති ලේඛණයේ නම් සඳහන් සේවකයින් අසූහත් (87) දෙනාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ."

කාර්මික ආරවුල් පනත යටතේ සම්පාදිත 21 (1) නියෝගය ප්‍රකාරව දෙපාර්ශවයේ සවිස්තරාත්මක ප්‍රකාශ දැක්වීමෙන් අනතුරුව පිළිතුරු හුවමාරු කරවා ගැනීමට අවස්ථාව සළසා දී සමථයක් සඳහා ඉඩ ලබා දුන් පසුව සමථයක් නොමැති බවට වාර්තා කිරීමෙන් අනතුරුව විභාගයට ගන්නා ලදී.

ඒ අනුව, ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා සමිතියේ ලේකම්, හේරත් මුදියන්සේලාගේ සරත් ආනන්ද කුමාරසිංහ මහතා සාක්ෂි ලබා දී A1 සිට A3(i) දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කාර සේවක පාර්ශවය නඩුව අවසන් කොට ඇති අතර, වගඋත්තරකාර සේවායෝජක පාර්ශවය විසින් හරස් ප්‍රශ්න අසමින් R1 සිට R4 (a) දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂිකරුවන් කැඳවීමකින් තොරව ඔවුන්ගේ නඩුව අවසන් කොට ඇත.

ඒ අනුව, දෙපාර්ශවයම තම තමන්ගේ ලිඛිත දේශන ගොනු කිරීමට අවස්ථාව සලසා දෙන ලද අතර, වගඋත්තරකාර සේවායෝජක පාර්ශවය තමන්ගේ ලිඛිත දේශන ගොනු කොට ඇත.

කාර්මික අධිකරණය හා බේරුම්කරු අධිකරණ බලය අත්පත් කරගන්නේ විෂය භාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි. එම යොමු කිරීම සමග සිද්ධියට අදාළව කම්කරු කොමසාරිස්තුමා විසින් සකස් කරනු ලැබූ ප්‍රකාශයක්ද එවනු ලැබ ඇත.

ඉහත 2 වන ඡේදයේ දක්වා යොමුව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී එහි ප්‍රධාන කොටස් 2ක් හඳුනා ගත හැකිය.

01. බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී ආයතනයේ බෝගල පතල 2014 වර්ෂයේ සිංහල අලුත් අවුරුදු නිවාඩුව වෙනුවෙන් 2014.04.12 වැනි දින සිට 2014.04.20 වැනි දින දක්වා වසා තැබීමේදී මීට පෙර පැවති පරිචයට පරිබාහිරව යමින් සේවකයින්ගේ වාර්ෂික නිවාඩු වලින් දින 05ක් අඩු කිරීමෙන් අගතියක් සිදු වී ඇති බවට අන්තර් සමාගම් සේවක සංගමය විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්නයි.

02. එලෙස යුක්ති සහගත වන්නේ නම්, මේ සමඟ අමුණා ඇති ලේඛණයේ නම් සඳහන් සේවකයින් අසූහත් (87) දෙනාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්නයි.

මෙම කාරණ දෙක වෙන වෙනම සළකා බැලිය යුතුව ඇත.

මුලින්ම 01 වන යොමු කිරීම සැලකීමේදී සහ ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා සමිතියේ ලේකම්, හේරත් මුදියන්සේලාගේ සරත් ආනන්ද කුමාරසිංහ මහතා සාක්ෂිය අනුව, වර්ෂ 2014 දක්වා පැවති ක්‍රමයට වෙනස්ව යමින්, එකී වර්ෂයේ සිංහල හා දෙමළ අලුත් අවුරුදු නිවාඩුව වෙනස් ආකාර ක්‍රමවේදයකට අනුව ලබා දීමට සහ ලබා ගැනීමට සිදු වී ඇති බව පෙනී යයි. එසේම එකී ක්‍රියාදාමය එතෙක් කලක් සමාගමේ පැවති ක්‍රියාදාමයට පටහැනි බවත්, එය අසාධාරණ බවත්, එය සේවකයන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද අනියම් ආකාරයෙන් කප්පාදුවට ලක් කිරීමක් බවටත්, ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබා දී ඇත.

එසේම, වගඋත්තරකාර සේවායෝජක සමාගම තුළ ක්‍රියාත්මක වන අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා සමිතිය මේ සම්බන්ධයෙන් සේවකයන් වෙනුවෙන් ඉදිරිපත්ව ඇති අතර, සාකච්ඡාවන් ගණනාවක් පැවතී ඇති බවත්, එහි ප්‍රතිඵලයක් නොවූ තැන අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට යොමු කරන ලද බවට සාක්ෂි ලබා දී ඇත.

අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ දී, පාර්ශවයන් අතර මෙකී ඉසව්ගතව කාරණයට අමතරව තවත් කාරණා 11ක් සම්බන්ධයෙන් ද සමථයකට එළඹ සහතික පත්‍රයක්ද නිකුත් කර ඇති බව පෙනී යයි.

ඒ කෙසේ වුවද, මෙකී කාර්මික ආරවුල බේරුම්කරණය දක්වා නොවිසඳී පැවතී ඇති අතර, දෙපාර්ශවය විසින්ම මෙම බේරුම්කරණයෙන් සේවකයන්ගේ වාර්ෂික අලුත් අවුරුදු නිවාඩු සම්බන්ධයෙන් ස්ථිර නියෝගයක් ලබා ගැනීමට ඇති කැමැත්ත ප්‍රකාශ කරමින් කරුණු දක්වා ඇත.

අදාළ සිද්ධිය සිදු වූ වර්ෂ 2014 අප්‍රේල් මාසය වන විට වගඋත්තරකාර සේවායෝජක සමාගමේ සේවකයන් 162 පමණ සේවය කළ බවත්, සේවකයන් නියෝජනය කරමින් ඉදිරිපත් වී ඇති අන්තර සමාගම් සේවක සංගමයේ සමාජිකත්වය ලබාගෙන ඇත්තේ ඉන් 42 පමණක් බවටත් කරුණු දක්වා ඇත. එසේම අන්තර් සමාගම් සේවක සංගමයේ සාමාජිකත්වය දරන එකී සේවකයන් අතරින් යම් පිරිසක්ද, අන්තර් සමාගම් සේවක සංගමයේ ස්ථාවරයේ නොමැති බවට හරස් ප්‍රශ්න අසා ඇත. එය වැඩිදුරටත් විග්‍රහ කරමින් වගඋත්තරකාර සේවායෝජක සමාගම විසින් 2014 අප්‍රේල් මාසයේ සිංහල අවුරුදු නිවාඩුවට අදළව තම තමන්ගේ පුද්ගලික නිවාඩු වලින් නිවාඩු ලබාගත යුතු ය යන සමාගමේ තීරණයට අනුව යමින් තමන්ගේ පුද්ගලික නිවාඩු වලින් ඒ සඳහා ඉල්ලුම් කොට ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරමින් හරස් ප්‍රශ්න අසා ඇත. එය සත්‍යයක් බව ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් හේරත් මුදියන්සේලාගේ සරත් ආනන්ද කුමාරසිංහ මහතා පිළිගෙන ඇත.

තවදුරටත්, හරස් ප්‍රශ්නවලට භාජනය කරමින්, සේවකයන් යම් පිරිසක් එකම කාරණයක් සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ අන්ත 2ක් නියෝජනය කර ඉල්ලුම්කාර සේවක පාර්ශවය සහ වගඋත්තරකාර සේවායෝජක සමාගමේ ලේඛනවලට අත්සන් තබා ඇති බවට හරස් ප්‍රශ්න අසා ඇත. ඒ අනුව, ඉල්ලුම්කාර සේවක පාර්ශවය, සේවකයන් අතර දැඩි නොසන්සුන්තාවයක් ඉහත කී කාරණය සම්බන්ධයෙන් පැවතී බවට ඒත්තු ගැන්වෙන අකාරයෙන් ඉල්ලුම්කාර සේවක පාර්ශවය සාක්ෂි ලබා දුන් නමුත් ඒ එසේමදැයි සළකා බැලීම වටී.

මේ කෙසේ වුවද, වගඋත්තරකාර සේවායෝජක සමාගම හරස් ප්‍රශ්න වලදී ලකුණු කරන ලද R1 දරන සාමූහික ගිවිසුම අනුව යමින් එකී ගිවිසුමේ 15(3) ට අනුව ඉල්ලුම්කාර සේවක පාර්ශවය සහ වගඋත්තරකාර සේවායෝජක සමාගම අතර වලංගුව පැවතී සාමූහික ගිවිසුම මත කටයුතු කළ යුතු බවට දැඩි ස්ථාවරයක් දරයි.

එසේම, එකී ගිවිසුම ඒ වනවිට වලංගුව පැවතී සහ අවලංගු කොට නොතිබූ තත්ත්වයක් හමුවේ වගඋත්තරකාර සේවායෝජක සමාගම නීතිවිරෝධීව කටයුතු කර නොමැති බවත්, ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ඇති බවත් ඒ සඳහා තමන්ට අයිතියක් නැති බවටත්, හරස් ප්‍රශ්න ඇසීමේදී මතු කොට ඇත.

ඉල්ලුම්කාර සේවක පාර්ශවය වෙනුවෙන් අන්තර් සමාගම් සේවක සංගමයේ ශාඛා සමිතියේ ලේකම්, හේරත් මුදියන්සේලාගේ සරත් ආනන්ද කුමාරසිංහ මහතා සාක්ෂි ලබාදෙමින් වර්ෂ 2019.09.10 සාක්ෂි සටහන් 30 පිටුවෙහි, වගඋත්තරකාර සේවායෝජක සමාගමට ඒ සඳහා අයිතියක් ඇති බවට පිළිගෙන ඇත.

ප්‍ර : එතකොට මහත්මයා, දැන් තමුන් පිළිගන්නවා ගිවිසුම ප්‍රකාරව, මෙහෙම නිවාඩු ලබා දෙන්න ආයතනයට බලයත් තියෙනවා කියලා.

උ: ඔව්

ඉල්ලුම්කාර සේවක පාර්ශවය ද, එකී R1 දරන සාමූහික ගිවිසුම අවලංගු කර ඇති බව හෝ ඉන් ඉවත් වූ බවට සක්ෂි ලබා දෙමින් හෝ කරුණු දක්වීමක් සිදු කර නොමැති හෙයින්, ප්‍රශ්නගත සිද්ධිය ඇතිවූ වර්ෂ 2014 අප්‍රේල් මසදී එක සාමූහික ගිවිසුම වලංගුව පැවති බවට තීරණය කළ හැක.

එසේම, R1 දරන සාමූහික ගිවසුම අත්සන් කොට ඇතතේ වර්ෂ 2011 ක්වූ මර්තු මස 03 වැනි දින දීය. එකී ගිවිසුමේ අංක 3 යටතේ එකී ගිවිසුම අඩුම තරමින් වර්ෂයක කාලයක් බල පැවැත්වෙන බවත්, වෙනත් ගිවිසුමක් අත්සන් කරනතුරු හෝ අවසන් කරනතුරු ක්‍රියාත්මක වන බවත් දන්වා ඇත.

ඒ අනුව, දෙපාර්ශවය විසින්ම R1 දරන සාමූහික ගිවිසුමට පසුව 2012, 2013 සහ 2014 වර්ෂයන්හි නව සාමූහික ගිවිසුම අත්සන් කළ බවට සාක්ෂි ලබා දී නොමැති අතර ඒ ආකාරයෙන් අත්සන් කරන ලද සාමූහික ගිවසුමක් ඉදිරිපත් කරනු ලබන්නේ, වර්ෂ 2015ට අදාළවය. එය R4 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2011.03.03 වැනි දින අත්සන් කරන ලද R1 දරන සාමූහික ගිවිසුමට පසුව නැවත සාමූහික ගිවිසුමක් අත්සන් කර ඇත්තේ, R4 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කර ඇති ලේඛනය අනුව 2015 ක්වූ ජූලි මස 30 වැනි දින දීය.

ඒ අතරතුර, වෙනත් සාමූහික ගිවිසුමක් නොතිබූ බව පෙනී යයි. ඒ අනුව 2014 අප්‍රේල් මාසයට අදාළව වලංගුව පැවතියේ R1 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කර ඇති සාමූහික ගිවිසුමට අදාළ එකඟතාවයන්ය.

ඒ අනුව, සාමූහික ගිවිසුමකින් සේවක සහ සේවායෝජක පාර්ශවයන් බැඳුණු කල්හි එකී සාමූහික ගිවිසුමේ කොන්දේසි ඉටු කිරීම දෙපාර්ශවයේම වගකීම සහ යුතුකම වේ. මන්ද, සාමූහික ගිවිසුමක් අත්සන් කිරීමට ප්‍රථම දෙපාර්ශවය විසින්ම සාකච්ඡාවට ගණනාවක් පවත්වා සාමූහික කේවල් කිරීම මත එකී ගිවිසුම්වලට එළඹීම සාමාන්‍ය ක්‍රමය වේ. R1 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කර ඇති වර්ෂ 2011 ක්වූ මාර්තු මස 03 වැනි දිනැති සාමූහික ගිවිසුමට සේවක පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත්ව ඇත්තේ, අන්තර් සමාගම් සේවක සංගමය වන අතර, එය ලංකාව තුළ ප්‍රබල ලෙස ක්‍රියාත්මක වන වෘත්තීය සමිතියක් වන බැවින් ද, සේවකයන්ගේ අයිතිවාසිකම් කේවල් කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර සේවායෝජක සමාගම සමග සම මට්ටමේ මැදිහත් වීමක් කළ හැකි පාර්ශවයකි.

ඒ අනුව, සේවකයන්ට අසාධාරණයක් වන ආකාරයෙන් සාමූහික ගිවිසුමට කොන්දේසි ඇතුළත් කළ බවට තර්කයක් ද ගොඩනැගිය නොහැක. එසේම එකී ගිවිසුම අත්සන් කිරීමෙන් පසු හබ කිරීමකින්/අලුත් කිරීමකින් තොරව ප්‍රශ්නගත සිද්ධිය ඇති වූ වර්ෂ 2014 දක්වා වසර 03ක් පැවතියේ සේවකයන් ඊට අනුගතව කටයුතු කළ නිසාය. යම් හෙයකින් 2011 මාර්තු මස 03 වැනි දින අත්සන් කළ R1 ලෙසට ලකුණු කොට ඉදිරිපත් කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් ඉල්ලුම්කාර සේවක පාර්ශවය අසාධාරණයකට, අයුක්තියකට හෝ අගතියකට පත්වූයේ නම් හෝ වීමට අවස්ථාව තිබුනේ නම්, එය වෙනස් කර ගැනීමට ඔවුනට හොඳ හැටි අවස්ථාව තිබුණි.

එසේම, පැමිණිලිකාර සේවක පාර්ශවය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් හේරත් මුදියන්සේලාගේ සරත් ආනන්ද කුමාරසිංහ මහතා 2017.01.22 වැනි දින සාක්ෂි සටහන් පිටුව 16හි "2017 දී අපි පාලන අධිකාරිය සමග ගිවිසුමකට ඇවිල්ලා ආව නිසා ආයතනයේ වැඩ කරන දින 3ක් ලබා දුන්නා. සිංහල අලුත් අවුරුදු නිවාඩු වෙනුවෙන්" යනුවෙන් සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව නව සාමූහික ගිවසුමක් මත මෙම ප්‍රශ්නය ස්ථිර වශයෙන් විසඳා ගෙන ඇත.

ඒ අනුව, සාමූහික ගිවිසුමක් අත්සන් කර ඇති අවස්ථාවකදී ඊට අදාළව කටයුතු කිරීම පාර්ශවයන්ගේ වගකීම සහ යුතුකම වන බැවින්, මේ අවස්ථාවේදී බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී ආයතනය නීතිවිරෝධීව කටයුතු කර නොමැති බව තීරණය කරමි. එසේම ඔවුන්ගේ ක්‍රියා කලාපය සාධාරණ සහ යුක්ති සහගත බව තීරණය කරමි. ඒ අනුව, මෙකී බේරුම්කරණයට අදාළව යොමු කර ඇති

01. බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී ආයතනයේ බෝගල පතල 2014 වර්ෂයේ සිංහල අලුත් අවුරුදු නිවාඩුව වෙනුවෙන් 2014.04.12 වැනි දින සිට 2014.04.20 දින දක්වා වසා තැබීමේදී මීට පෙර පැවති පරිචයට පරිබාහිරව යමින් සේවකයින්ගේ වාර්ෂික නිවාඩු වලින් දින 05ක් අඩු කිරීමෙන් අගතියක් සිදුවී ඇති බවට අන්තර් සමාගම් සේවක සංගමය විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්නට, එසේ නොවන බවට තීරණය කරමි. ඒ අනුව,

02. එලෙස යුක්ති සහගත වන්නේ නම්, මේ සමග අමුණා ඇති ලේඛනයේ නම් සඳහන් සේවකයින් අසූහත් (87) දෙනාට හිමි විය යුතු සහනයන් මොනවාද යන්නට, ඉහත 1 හි පිළිතුරට අදාළව සහනයන් හිමි වීමක් අදාළ නොවන බව තීරණය කරමි.

මෙය ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි.

**එස්. ලොකුබෝගහවත්ත,**
බේරුම්කරු.

2021 අගෝස්තු මස 17 වැනි දින.

11 - 599

---

*මගේ අංක* : IR /COM/ 03/2017/243.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.07.11 දිනැති හා අංක 2079/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.07.04 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අවිස්සාවේල්ල, කුඩාගම පාර, කර්මාන්තපුර මාවත, අංක 05 හි පදිංචි එම්. ඩී. නිශාන්ති මිය සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, අංක 234 හි පිහිටි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.05.15 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය* : IR/COM/03/2017/243.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

එම්. ඩී. නිශාන්ති,
අංක 05, කර්මාන්තපුර මාවත,
කුඩාගම පාර, අවිස්සාවේල්ල.
පළමු පාර්ශවය

*නඩු අංකය :* A/46/2018. සහ

එදිරිව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල සම්බන්ධව

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සම්බන්ධතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමේන් නිරවුල් කිරීම සඳහා 2018.07.04 දින දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩුදුන් කාරණය :-*

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2018 ජූලි මස 04 වැනි දිනැතිව එවා ඇති ලිපියේ දැක්වෙන්නේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මාණ්ඩලික සහකාරවරියක් ලෙස සේවය කරන එම්. ඩී. නිශාන්ති මහත්මියට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා සභාපතිගේ අංක : AD/ 2/5/84/2009 සහ 2006.12.06 දිනැති ලිපිය මගින් ලබාදී ඇති විනය නියෝගය යුක්ති සහගතද යන්න සහ එසේ නොවන්නේ නම් ඇයට ලබාදිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

*පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය :-*

ඉහත කී ආරාවුල විභාගයට ගැනීමට පෙර ආරවුලට හේතු වූ කරුණු කවරේද යන්න බේරුම්කරණය වෙත යොමුකරන මෙන් 2018.07.18 දින දෙපාර්ශවය වෙතම දන්වා යවා ඇති අතර ඒ අනුව දෙපාර්ශවයෙන්ම සවිස්තරාත්මක ප්‍රකාශ ගෙන්වාගෙන ඇත. ඒ අනුවඃ

1. ඉල්ලුම්කාර පාර්ශවය විසින් තම පළමු ප්‍රකාශය A1 සිට A8 දක්වා ඇමුණුම් සහිතව 2018.07.31 වැනි දින ගොනුකර ඇති අතර, එහිදී නීතියට අනුගත නොවන ආකාරයෙන් ඉල්ලුම්කාරියට චෝදනා ඉදිරිපත් කිරීමට හා විනය දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් මූලික විරෝධතා ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කාරිය තම මූලික විරෝධතා තුළින් දක්වා ඇත්තේ තමන් ඒකාබද්ධ සේවයෙන් වැටුප් ලබන සේවිකාවක් නොව 1981 අංක 21 දරන පාර්ලිමේන්තු පනතකින් පිහිටවූ අර්ධ රජයේ ආයතනයක සේවිකාවක් ලෙස වග උත්තරකාර ආයතනයේ සේවය කරන බවත් තමන් රජයේ ඒකාබද්ධ අරමුදලින් වැටුප් ලබන සේවකයෙක් නොවන බවත් එබැවින් තමන්ට ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි දඬුවම් පැමිණවීම අවිධිමත් සහ නීතියට අනුගත නොවන බවත්ය. තවද ඉල්ලුම්කාරියගේ සේවය අත්හිටුවා වසර තුනකුත් මාස පහකට පසු චෝදනා පත්‍රයක් නිකුත් කිරීමද, තමන්ගේ පත්වීම් ලිපියේ කොන්දේසි ගත නොවන ආයතන සංග්‍රහය ඒ සඳහා අදාළ කරගැනීම නීති විරෝධී බවට ද කරුණු දක්වා ඇත. තවද ආයතන සංග්‍රහය බල පවත්වන්නේ රජයේ සේවකයන්ට පමණක් බවත් තමන් රජයේ සේවකයෙක් නොවන බැවින් එකී නීතියට අනුගත නොවන බවද, ඉහල අධිකරණ තීරණද, ගෙනහැර දක්වමින් පෙන්වාදී ඇත. තවද, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා විසින් ඒක පුද්ගල විනිශ්චය සභාවක් පත්කර, එකී සභාපති නිල තනතුර යටතේ ම විනය දඬුවම් පැමිණවීම ස්වභාවික යුක්ති මූලධර්මවලට අනුගත නොවන බවටද මූලික විරෝධතාවය තුළින් කරුණු දක්වා ඇත.

මේ හැර වග උත්තරකරු විසින් A5 ලේඛනය මගින් ඉල්ලුම්කාරියට පනවා ඇති විනය දඬුවම් නීතියට අනුගත නොවන බවට ඉල්ලුම්කාරිය තම පළමු ප්‍රකාශය මගින් දීර්ඝ වශයෙන් කරුණු දක්වා ඇති අතර, ඒ අනුව එකී දඬුවම් ඉවත්කර සහනයන් ලබාදෙනමෙන් අයදීම් කර ඇත.

2. දෙවන පාර්ශවය වන වග උත්තරකාර පාර්ශවය සිය පළමු ප්‍රකාශය 2018.08.08 දින ඉදිරිපත් කර ඇත. වග උත්තරකාර පාර්ශවයේ පළමු ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ වග උත්තරකාර ආයතනයේ මාණ්ඩලික සහකාර තනතුරේ සේවය කරන ඉල්ලුම්කාරිය සමග ඇති වූ කාර්මික ආරවුලට හේතු සහ ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳව වේ.

එනම් කාර්යාංශයට අයත් ලංකා බැංකු ආයතනික ශාඛාවේ 1650 දරන ගිණුමෙන් රුපියල් හාරලක්ෂය (රු. 400,000/-) බැගින් වූ චෙක්පත් දෙකකින් වංචනික ලෙස මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශයෙන් කරන ලද විමර්ශනයකදී එම චෙක්පත් භාරව මුදල් අංශයේ කටයුතු කළ එනම් S1 ශ්‍රේණිය මාණ්ඩලික තනතුරක සේවය කළ ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කිරීම 2009.10.21 දින සිදුවූ බවත් ඉල්ලුම්කාරිය ඒ සම්බන්ධයෙන් කරන ලද අභියාචනා සලකා බලා වංචාව සම්බන්ධයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ පවතින නඩුවේ තීරණයට යටත්ව ඇය 2012.01.16 දින නැවත සේවයේ පිහිටවූ බවත්ය. තවද එකී නිලධාරිනියට විරුද්ධව චෝදනා 19 කින් යුතු චෝදනා පත්‍රයක් 2013.03.27 දිනැතිව නිකුත් කර ඇති අතර, පසුව පැවැත්වූ විධිමත් විනය පරීක්ෂණය මගින් ඇය චෝදනා 13 කට නිවැරදිකරු බවටත් චෝදනා හයකට පමණක් වැරදිකරු බවටත් පත්ව ඇති බව සඳහන්

කර ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ඇයට දඬුවම් පමුණුවා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඇය විසින් අභියාචනා කළද කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකී අභියාචනා ප්‍රතික්ෂේප කර ඇති බව දක්වා ඇත.

3. ඉල්ලුම්කාර පාර්ශ්වයේ දෙවන ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ වග උත්තරකාර පාර්ශවයේ පළමු ප්‍රකාශය ඉල්ලුම්කාරිය විසින් යොමුකර ඇති කාර්මික ආරාවුලේ යොමුවට අනුගතව ඉදිරිපත් කර නොමැති බැවින් සහ එකී කරුණු නීතිමය සහ සිද්ධිමය වශයෙන්ද කල්පිත පමණක් බැවින් එය බැහැර කළ යුතු බවයි. තවද කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ මෙම සිද්ධියට අදාලව කිසිම නඩුවක් පවරා පවත්වාගෙන නොයන බවද ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටි. තවද "කාර්යාංශයට අයත් චෙක්පතකින් මුදල් ලබාගැනීම" යන චෝදනාව චෝදනා පත්‍රයක් මගින් ඉල්ලුම්කාරිය වෙත එල්ල කර තිබුනද පසුව එකී චෝදනාව වග උත්තරකරු විසින්ම ඉවත් කරගෙන ඇති බව ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටි. තවද ඉල්ලුම්කාරිය විසින් කාර්යාංශයට මුදලක් පාඩුකිරීමක් සිදු නොකොට වග උත්තරකරු විසින් ඉල්ලුම්කාරියගේ වැටුපෙන් මුදල් අය කරන්නේ කවර නීතියකට අනුගතවද යන්න ඉල්ලුම්කාරිය ප්‍රශ්න කර සිටි. තවද ඉල්ලුම්කාරියට පනවා ඇති දඬුවම් අසාධාරණ බව දක්වමින් ඉල්ලුම්කාරිය අභියාචනා කලද වග උත්තරකරු විසින් කිසිදු හේතුවක් නොදක්වා අභියාචනය ප්‍රතික්ෂේපකර ඇති බවද ඉල්ලුම්කාරිය සිය දෙවන ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත.

4. දෙවන පාර්ශවය සිය දෙවන ප්‍රකාශය 2018.10.01 දින ඉදිරිපත් කර ඇති අතර මූලික විරෝධතාවන් වශයෙන් දක්වා ඇත්තේ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති පනත ප්‍රකාරව කාර්යාංශයේ විනය කටයුතු සඳහා ආයතන සංග්‍රහයේ දෙවන කොටස භාවිතා කිරීමට කාර්යාංශ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබාදී ඇති බවත් එලෙස පරිපාලන කටයුතු සඳහා ආයතන සංග්‍රහය බල පවත්වන බැවින් ඒ පිළිබඳව කාර්යාංශ නිලධාරින් දැනුවත් වියයුතු බවත් දක්වා ඇත. මෙලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අනුගමනය කරන නීති රීති සහ රෙගුලාසි අනුව ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කර ඇති බවද වැඩි දුරටත් කියා සිටී. තවද 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති පනත ප්‍රකාරව කාර්යාංශයේ විනය බලධාරියා වශයෙන් සභාපතිවරයාට බලයක් ඇති බවටද මූලික විරෝධතාවන් තුලින් කරුණු දක්වා ඇත.

තවද දෙවන පාර්ශවයේ දෙවන ප්‍රකාශය තුලින් වැඩිදුරටත් දක්වා ඇත්තේ චෝදනා 19ක් අඩංගු චෝදනා පත්‍රයක් ඉල්ලුම්කාරියට ලබා දුන්නද "සෘජුවම මුදල් වංචා කිරීම" සම්බන්ධයෙන් ඇයට චෝදනා නොකළ බවත්, අවසාන වශයෙන් ඇය එකී චෝදනාපත්‍රයේ චෝදනා වලින් හයකට පමණක් වැරදිකරු කර ඇති බවත් ඒ අනුව දඬුවම් නියම කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

මෙසේ දෙපාර්ශවයේම ප්‍රකාශ ලබා ගැනීමෙන් අනතුරුව මෙම නඩුවේ විභාගය සඳහා දෙපාර්ශවයම 2018.10.30 දිනට නියම කළද, වග උත්තරකාර පාර්ශවය එදිනට පැමිණීමට නොහැකි බවට හේතු දක්වා සිටියෙන් නඩුවේ විභාගය 2018.12.26 දිනට නියම කරන ලදී. එදින නඩු විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණි අතර දෙපාර්ශවය අතර මෙම නඩුව සම්බන්ධයෙන් සමථයක් ඇති නොවූයෙන් ඉල්ලුම්කාර පාර්ශවය තම නඩුව ආරම්භ කරමින් මූලික සාක්ෂි ලබා දෙන ලදී. 2019.01.07 දින වග උත්තකරු විසින් ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීම සහ ඉල්ලුම්කාර පාර්ශවය විසින් නැවත ප්‍රශ්න විමසීමද සිදුකරන ලදී. 2019.01.21 දින වග උත්තරකාර පාර්ශවය විසින් සාක්ෂි කැඳවීම් කර, සාක්ෂිකරුගෙන් මූලික සාක්ෂි ලබා ගන්නා ලදී. තවද 2019.02.28 දින එකී සාක්ෂිකරුගෙන් වැඩිදුර මූලික සාක්ෂි විමසීම සිදුකල අතර 2019.04.03 වන දින ඉල්ලුම්කාර පාර්ශවය වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීම සිදුකරන ලද අතර වගඋත්තරකාර පාර්ශවය විසින් නැවත ප්‍රශ්ණ විමසීමද සිදුකරන ලදී.

ඉහත පරිදි සාක්ෂි විමසීම අවසානයේ දෙපාර්ශවය විසින් ලිඛිත දේශන ගොනු කලද ඉල්ලුම්කාර පාර්ශවය විසින් තමන් ඉල්ලා සිටින මූල්‍යමය සහනයන් කවරේද නිශ්චිතව ගණනය කර ඉදිරිපත් කිරීමක් තමන්ගේ පළමු සහ දෙවන ප්‍රකාශ මගින් හෝ සාක්ෂි විමසීමේ දී ඉදිරිපත් කර නොතිබූ හෙයින් නැවත සාක්ෂි විමසීමට යටත්ව අදාළ තොරතුරු ගොනුකිරීමට ඉල්ලුම්කාර පාර්ශවයට ඉඩ දෙන ලදී. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවය විසින් තමන්ට ලැබිය යුතු දීමනා පිළිබඳව සවිස්තර වාර්තාවක් 2019.12.23 දිනැතිව වග උත්තරකරුටද පිටපතක් යැවීමෙන් පසු ගොනුකර ඇත. ඒ අනුව දෙපාර්ශවයම කැඳවා මේ පිළිබඳව සාක්ෂි විමසීමට 2020.01.30 දිනට දින නියම කල අතර වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහතා විසින් එම දිනයෙහි වෙනත් අධිකරණයක පෙනී සිටින බැවින් එදිනට පැමිණිය නොහැකි බව දන්වා ඇත. කෙසේ වුවද රටේ පැවති වසංගත තත්වය මත මෙම නඩු විභාගය සඳහා දෙපාර්ශවය නැවත කැඳවීම ප්‍රමාද වූ අතර 2021.09.16 දින දෙපාර්ශවය කැඳවා නැවත සාක්ෂි විමසන ලදී. 'Y'1 ලේඛනය ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාර පාර්ශවය තම ඉල්ලීම් සාක්ෂි විමසීමේදී ඉදිරිපත් කල අතර මෙහිදී එකී සාක්ෂිය හරස් ප්‍රශ්ණවලට භාජනය විය. එහිදී වග උත්තරකාර පාර්ශවය 'Y' 1 ලේඛනයේ අන්තර්ගතය සංශෝධනය විය යුතු බවට කරුණු දක්වා සිටි අතර ඒ අනුව දෙපාර්ශවය සාකච්ඡා කර සංශෝධිත වාර්තාවක් සති දෙකක් තුල අධිකරණයේ ගොනුකිරීමට එකඟ විය. මෙකී වාර්තාව 2020.09.28 දින ගොනුකළ අතර මේ පිළිබඳව සාක්ෂි විමසීම සඳහා දෙපාර්ශවය කැඳවීම 2021.03.04 දිනට යොදා ගන්නා ලද අතර එකී සාක්ෂි විමසීමේදී ඉල්ලුම්කාර පාර්ශවය විසින් එම ලේඛනය D 1 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙහිදී දෙපාර්ශවයේ එකඟතාවය මත මෙකී ලේඛනය සකස්කර ඇති හෙයින් වගඋත්තරකාර පාර්ශවය මේ පිළිබඳව විරෝධතාවයක් නොමැති බව ප්‍රකාශ කල හෙයින් නඩුව අවසන් කර නියෝගය සඳහා යොමු කිරීමට නියමිත විය.

*<u>සාක්ෂි විමසීම් :</u>*

*<u>ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂි :</u>*

මෙම නඩුවේ සාක්ෂි විමසීම් 2018.12.26 දින ආරම්භ වූ අතර එහිදී ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කාරිය වන එම්. ඩී. නිශාන්ති මිය සිය සාක්ෂිය ප්‍රථමයෙන් ආරම්භ කරන ලදී. ඒ අනුව ඉල්ලුම්කාරිය 1994.03.15 දින සිට වගඋත්තරකාර ආයතනයේ සුභසාධක සහකාර වශයෙන් පත්වීම් ලැබූ බවත් A1 නමැති පත්වීම් ලිපිය සලකුණු කර ඉදිරිපත් කරමින් එකී පත්වීම් ලිපියට අනුව තමා සේවය ආරම්භ කල බවත් කියා සිටී. කෙසේ වුවද තමන්ගේ පත්වීම් ලිපියේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනවලට යටත්ව කටයුතු

කළ යුතු බවට ප්‍රතිපාදන දක්වා නොමැති බවද ප්‍රකාශ කර ඇත. ඉල්ලුම්කාරිය වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ 2009 වන විට තමන්ගේ මුදල් අංශයට අනුයුක්තව ඉහල අධීක්ෂණ නිලධාරීන් යටතේ කටයුතු කළ බවයි.

ඉල්ලුම්කාරිය A2 ලේඛනය සලකුණු කර තවදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටින්නේ එකී ලේඛනය අනුව වග උත්තරකරු විසින් තම වැඩ තහනම් කිරීම සිදුකල අතර මූලික පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු එවැන්නක් සිදුකර ඇති බවයි. තවද ඉල්ලුම්කාරිය විසින් චෙක්පත් කිහිපයකින් වංචනික ලෙස මුදල් ලබාගත් බවට එකී ලේඛනය මඟින් තමාට සෘජුවම චෝදනා කර ඇති බවද ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර සිටී.

කෙසේ වුවද තමන් එවැනි මුදල් වංචාවක් කිසිසේත්ම සිදු නොකළ බවත් චෙක්පත් මුද්‍රණය පරිඝණකය ආශ්‍රිතව සිදු වන අතර, අත්සන් කිරීම සම්බන්ධයෙන් නිලධාරින් දෙදෙනෙකුගේ අත්සන් නිර්දේශ කර බැංකුව වෙත යවා ඇති බවත්, තවද තමන්ගේ අත්සන එලෙස නිර්දේශ කර නොමැති බවද ප්‍රකාශ කර සිටී. එමෙන්ම වැඩ තහනම් කළ කාලය සඳහා තමන්ට අඩ වැටුපක් හෝ ගෙවා නොමැති බවත් ඒ සඳහා තමන් ඉල්ලීම් කළ පසු වසර දෙකකට පසු අඩ වැටුප් ගෙවා ඇති බවද වැඩි දුරටත් කියා සිටී. (එම කරුණට අදාළ ලේඛනය A3 ලෙසද සලකුණු කර සිටී.) තවද එකී ලේඛනය අනුව  තමන්ට ආයතන සංග්‍රහය අදාළ වන බවට දැනුවත් වූ බවද කියා සිටි. කෙසේ වෙතත් දීර්ඝ කාලයක් තමාගේ වැඩ තහනම් කර තිබූ අතර තමාගේ ඉල්ලීම පරිදි 2012.10.16 දින තමන් නැවත සේවයේ පිහිට වූ බව වග උත්තරකාරිය ප්‍රකාශ කර ඇත. එමෙන්ම වැඩ තහනම් කිරීමෙන් වසර හතරකට පමණ පසුව තමන්ට 2013.03.27 දින A වශයෙන් සලකුණු කරනු ලබන චෝදනා පත්‍රය ලැබුණු බවද, එහි චෝදනා 19 ක් සඳහන් වූ බවත් පසුව එයින් චෝදනා 13 කට නිවැරදිකරු කර ඇති අතර ඒ අනුව නිකුත් කර ඇති A6 විනය නියෝගය අනුව වැරදි හයකට පමණක් දඬුවම් නියම කර ඇති බව ප්‍රකාශ කර සිටී. ඉල්ලුම්කාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමන් බරපතල මුල්‍ය චෝදනා වලින් නිදහස්ව සිටියදී පනවා ඇති දඬුවම් සාධාරණ නොවන බවත් එකී දඬුවම් ඉවත්කර තමන්ට සහනයක් ලබා දෙන ලෙසයි.

2019.01.07 දින ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්ණ විමසීම සිදුකර ඇති අතර එහිදී ඉල්ලුම්කාරියගේ නිවාඩු සහ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන්නේද යන්න වග උත්තරකාර පාර්ශවයෙන් ප්‍රශ්ණ කර ඇති අතර ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර ඇත්තේ ඒ පිළිබඳව තමන් දැනුවත්ව නොමැති බවයි. මේ හැර වග උත්තරකරු විසින් ඉල්ලුම්කාරියගෙන් මූලික පරීක්ෂණ සහ විනය පරීක්ෂණ පිළිබඳව විමසා ඇති අතර එහිදී තමන්ට යම් බාධාවක් සිදුවූයේදැයි ඉල්ලුම්කාරියගෙන් විමසීමේදී ඇය ප්‍රකාශ කර ඇත්තේ එවැනි බාධාවක් නොවූ බවත් එහෙත් පරීක්ෂණය සිදුකිරීමට කල් ගතවූ බවත් පරීක්ෂණය අවසානයේ තමන්ට විනය නියෝගයක් ලැබුණු බවද ප්‍රකාශ කර ඇත. මේ හැර ශ්‍රී ලංකා විදේශසේවා නියුක්ති කාර්යාංශයට අයත් ලංකා බැංකුවේ අංක 1650 දරන ජංගම ගිණුමට අදාළ චෙක්පත් නිකුත් කිරීමේ චෙක්පත් රෝල තමන් භාරයේ තිබූ බවත් මෙම නඩුවට අදාළ අස්ථාන ගත වූ චෙක්පත් එම චෙක්පත් රෝලයේ අන්තර්ගතවූවක් බවත් ඉල්ලුම්කාරිය පිළිගෙන ඇත. එමෙන්ම ඇය එකී චෙක්පත් අස්ථාන ගත වූ බව දැනගත්තේ වෙනත් නිලධාරිනියක් ඒ පිළිබඳව තමන්ට දැන්වූ පසුව බව ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

වැඩිදුර හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කාරිය භාරයේ තිබූ චෙක්පත් දෙකක් අස්ථානගත වීමෙන් වග උත්තරකාර ආයතනයට රු. 800,000.00 ක් අහිමිව ඇති බවත් ඉල්ලුම්කාරිය නිසි අවධානයෙන් කටයුතු කලේ නම් එවැන්නක් සිදු නොවන බවටත් වග උත්තරකාර පාර්ශවය චෝදනා කර ඇති අතර ඉල්ලුම්කාරිය එකී චෝදනා ප්‍රතික්ෂේප කර ඇත. තවද නැවත ප්‍රශ්න විමසීමේ දී ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර ඇත්තේ තමන් එලෙස චෝදනාව ප්‍රතික්ෂේප කිරීමට හේතුව තමන්ගේ සහායට සිටි නිලධාරීන්ටද තමන්ගේ ලාච්චුව පාවිච්චි කිරීමටත් චෙක්පත් මුද්‍රණය කිරීමටත් කළමනාකාර මුදල් විසින් ඉඩ ලබාදී ඇති හෙයින් බවයි. තවද චෙක්පත් අත්සන් කර නිලධාරීන් දෙදෙනා සහ බැංකුව විසින් නිසි අවධානයෙන් කටයුතු කලේ නම් මෙම අලාභය සිදු නොවන බව ඉල්ලුම්කාරිය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. මේ අනුව ඉල්ලුම්කාරියගේ සාක්ෂි අවසන් විය.

*වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීම :*

2019.01.21 දින වග උත්තරකරු වෙනුවෙන් සාක්ෂි මෙහෙයවීම සිදු කරන ලද අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කළමනාකාර පරිපාලන සහ මානව සම්පත් සුසිල් කුමාරපේලි යන අය විසින් සාක්ෂි ලබාදෙන ලදී.

මෙහෙදී සාක්ෂිකරු පවසා සිටින්නේ, ඉල්ලුම්කාරිය 1994 සිට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවය කරන බවත්, වග උත්තරකාර ආයතනයෙන් සිදුකල අභ්‍යන්තර විගණන පරීක්ෂණකයට පසු 2013.03.27 දින ඇය වෙත චෝදනා 19 කින් යුතු චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති බවත් තවද ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් මූලික විගණන පරීක්ෂණයක් කිරීමෙන් පසුව මෙම චෝදනා පත්‍රය ලබාදී ඇති බව ද ප්‍රකාශ කර සිටි. පසුව ඒ පිළිබඳව නැවත විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් එහිදී ඉල්ලුම්කාරිය චෝදනා හයකට වැරදිකරු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද වග උත්තරකාර ආයතන 2002 වසරේ සිට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුගමනය කරන බවත්,  1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 16.2 ඊ යටතේ එසේ අදාළ කරගන්නා අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, 2002 වසරේ සිට එලෙස අදාළ කර ගන්නා බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ කාර්ය මණ්ඩලයද ඒ පිළිබඳව දැනුවත්ව ඇති බවයි. තවද ඉල්ලුම්කාරියට විරුද්ධව ඇති චෝදනා පත්‍රයේ පළමුවන චෝදනාවේ වරද සිදුවනවිට ඉල්ලුම්කාරිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් අංක 1650 දරන ලංකා බැංකු ගිණුමට අදාළ චෙක්පත් භාරව කටයුතු කළ බවත්, කළමනාකාර මුදල් හා පරිපාලන අංශයේ නිලධාරියෙක් යටතේ මෙලෙස රාජකාරි පවරා තිබූ බවත් ප්‍රකාශ කර සිටී.

2019.02.28 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් වැඩිදුර මූලික සාක්ෂි විමසීම සිදුකර ඇති අතර එහිදී සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ මුදල් අංශයේ කළමනාකරු විසින් ඉල්ලුම්කාරියට චෙක්පත් රෝලක් ලෙසින් භාරදී ඇති බවත්, මෙම චෙක්පත් රක්ෂණ වන්දි ගෙවීම් සඳහා භාරදී තිබූ බවත්, ඉල්ලුම්කාරියගේ චෝදනා පත්‍රයේ සඳහන් චෙක්පත් දෙකද මෙම රෝහලට ඇතුලත්ව තිබූ අතර එකී චෙක්පත් මගින් ලක්ෂ අටක මුදලක් හුවමාරු වී ඇති බවත් කෙසේ

වුවද එකී චෙක්පත් වලින් මුදල් ලබාගත් පුද්ගලයා කවරෙක්ද යන්න තමා නොදන්නා බවයි. ඉල්ලුම්කාරිය වගකීමෙන් කටයුතු කලේ නම් මෙවැනි කාර්යාංශයට මෙවැනි පාඩුවක් සිදු නොවන බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත.

තවද ඉල්ලුම්කාරියට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් සිදුකල බවත් එය කිසිදු බාධාවක් හෝ මැදිහත්වීමකින් තොරව කළ බවද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින අතර එකී ඒක පුද්ගල විනිශ්චය සභාවේ වාර්තාව X 1 වශයෙන් සලකුණු කර ඉදිරිපත්කර සිටී. තවද ආයතන සංග්‍රහයේ 24:3:1 පරිදි බරපතල දඬුවම් නියම කලහැකි වුවත් වග උත්තරකරු විසින් ඇයට සුළු දඬුවම් නියමකර ඇති බවද සාක්ෂිකරු ප්‍රකාශ කර සිටී. එමෙන්ම වග උත්තරකාර ආයතනය තම ආයතනයේ කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 65/2002 මඟින් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අදාළ කර ගන්නා බවද වැඩි දුරටත් කියා සිටී. (එකී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව X 2 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර සිටී.)

වග උත්තරකරුගේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී මූලික පරීක්ෂණයක් නොකර විගණන පරීක්ෂණයක් පමණක් සිදු කිරීම ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනවලට අනුරූප නොවන බවට ඉල්ලුම්කාර පක්ෂය චෝදනා කර ඇත. තවද විනය පරීක්ෂණයක් සිදුකර අවසන් කිරීමට වසර තුනක ප්‍රමාදයක් සිදු වීමෙන් ඉල්ලුම්කාරිය දැඩි අපහසුතාවයකට පත්ව ඇති බවද වැඩි දුරටත් ප්‍රකාශ කර ඇති අතර වග උත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ එකී ප්‍රමාදය හේතුවෙන් අඩ වැටුප් ගෙවීම් සිදු කර ඇති බවයි.

මේ හැර අස්ථානගත වූ චෙක්පත බැංකුවෙන් හුවමාරු කරගෙන ඇත්තේ කවරෙක්ද යන්න හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කාර පාර්ශවයෙන් විමසූ අතර වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ඒ ගැන තමන්ට අවබෝධයක් නොමැති බවත් මේ පිළිබඳව අධිකරණයේ නඩුවක් පවතින බවත්ය.

ඉල්ලුම්කාරියට චෙක්රෝල් භාරදීම ලිඛිතව සිදු කර නොමැති බවට හරස් ප්‍රශ්න විමසීමේදී ඉල්ලුම්කාර පාර්ශවය කරුණු දක්වා ඇත. තවද ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රකාශ කර සිටින්නේ X 1 ලේඛනය අනුව ඉල්ලුම්කාරිය වංචාවක් කිරීම හෝ එසේ කිරීමට හිතාමතා අනුබලදීම, චෙක්පත් අස්ථානගත කිරීමෙන් රාජකාරි කටයුතු පැහැර හැරීම, හොර අත්සන් දීමෙන් රු. 800,000.00 මුදලක් වංචාකිරීම, අයථා පරිහරණයට වෙනත් අයෙකුට අවස්ථාවක්දීම 390 මුල්‍ය රෙගුලාසිය අනුව කටයුතු නොකිරීමෙන්, අනවධානයෙන් රාජකාරි කටයුතු කිරීම, ආයතනයට රුපියල් ලක්ෂ අටක මුල්‍ය අලාභ කිරීම, යනාදී වශයෙන් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 13 කින් ඉල්ලුම්කාරිය නිදහස් කර ඇති බව වග උත්තරකරුගේ සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී පිළිගෙන ඇත.

*<u>සාක්ෂි විශ්ලේෂණය සහ ප්‍රදානය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය</u>* :

මෙම නඩුවේ විසඳිය යුතු කරුණ වන්නේ ''ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මාණ්ඩලික සහකාරවරියක් ලෙස සේවය කර එම්. ඩී. නිශාන්ති මහත්මියට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා සභාපතිගේ අංක AD/2/5/84/2009 සහ 2006.12.06 දිනැති ලිපිය මඟින් ලබාදී ඇති විනය නියෝගය යුක්ති සහගතද යන්න හා එසේ නොවන්නේ නම් ඇය වෙත ලබාදිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.'' ඉහතින්ද සඳහන් කළ පරිදි මේ සම්බන්ධයෙන් කරුණු විමර්ශනය සඳහා පාර්ශවයන්ගෙන් මූලික ප්‍රකාශ ලබාගත් අතර දෙවනුව පාර්ශවයේ සාක්ෂි විමසීමද අවසාන වශයෙන් දෙපාර්ශවයේ ලිඛිත දේශන ලබා ගැනීමද තුළින් කරුණු විමර්ශනය කරන ලදී.

(01) ඉල්ලුම්කාර පාර්ශවයේ මූලික ප්‍රකාශන සහ මූලික සාක්ෂි විමසීමේදී විශේෂයෙන් විරෝධතාවයට ලක්වූ කරුණක් වන්නේ ඉල්ලුම්කාරිය රජයේ සේවිකාවක් හෝ රජයේ ඒකාබද්ධ සේවයේ සේවිකාවක් නොවන බැවින්ද ඇය අර්ධ රජයේ සේවිකාවක් බැවින්ද ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන පරිදි, දඬුවම් පැමිණවීම අවිධිමත් සහ නීතියට අනුගත නොවන බවයි. කෙසේ වෙතත් ඉල්ලුම්කාරියගෙන් 2018.12.26 දින සාක්ෂි විමසීමේදී ඇය පහත පරිදි ප්‍රකාශ කර ඇත.

*ප්‍රශ්නය* : ඒ 2 ලේඛනය අනුව ඔබගේ වැඩ තහනම් කරන්නේ ආයතන සංග්‍රහයේ 48 වැනි වගන්තියේ 31.5.1 උප වගන්තිය යටතේ කියලා සඳහන් කර තියෙනවා ?

*පිළිතුරු* : ඔව්

*ප්‍රශ්නය* : ආයතන සංග්‍රහය ඔබට බල පවත්වනවා කියලා දැනගත්තේ කොයි කාලේද?

*පිළිතුර* : මේ ලිපියෙන් පස්සේ.

මේ අනුව ඉල්ලුම්කාරියගේ මූලික සාක්ෂියේදී ඇය විසින්ම ආයතන සංග්‍රහය තමන්ට බලපාන බව පිළිගෙන ඇත.

තවද 2019.01.21 දින වග උත්තරකාර පාර්ශවය විසින් වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීමේදී වග උත්තරකාර ආයතන 2002 වසරේ සිට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුගමනය කරන බවත්, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 16.2 ඊ යටතේ එසේ අදාළ කරගන්නා අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් 2002 වසරේ සිට එලෙස අදාළ කර ගන්නා බවත් කාර්ය මණ්ඩලයද ඒ පිළිබඳව දැනුවත්ව ඇති බවත් ප්‍රකාශ කර ඇත.

තවද 2019.02.28 දින වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගෙන් වැඩිදුරටත් සාක්ෂි විමසීමේදී ද මේ බව වැඩි දුරටත් තහවුරු වී ඇත.

*ප්‍රශ්නය* : සාක්ෂිකරු කාර්යාංශයේ නිලධාරින් සම්බන්ධයෙන් විනය කාර්ය පරිපාටිය ලෙස ආයතන සංග්‍රහය භාවිතා කරන්න කොයි කාලේදි පටන් ගත්තේ?

*පිළිතුරු* : 2002 අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව විනය යටයුතු සඳහා යොදා ගන්නවා යනුවෙන් ප්‍රකාශ කර ඇති අතර, එකී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය වන 18.46.1 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 65/2002 "X"2 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත.

මේ අනුව ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් තම ආයතනයේ කටයුතු සඳහා 2002 වසරේ සිට අදාළ කරගෙන ඇති හෙයින් ඒ අනුව ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදනවලට අනුකූලව විනය කටයුතු කිරීම නීතියට අනුගත නොවන බවට ඉල්ලුම්කාර පාර්ශවයෙන් ගෙන එන විරෝධතාව බිඳ හෙළීමට වග උත්තරකාර පාර්ශවය සමත්ව ඇත. ඒ අනුව ආයතන සංග්‍රහයට අනුව ඉල්ලුම් කාරිය සම්බන්ධයෙන් විනය කටයුතු කිරීම නීති විරෝධී නොවන බව නිගමනය කරමි.

(2) 2016.12.06 දිනැතිව ඉල්ලුම්කාරියට පනවා ඇති විනය නියෝගය යුක්ති සහගතද යන්න මීළඟට සලකා බැලිය යුතු කාරණය වේ. ඉල්ලුම්කාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කිරීමේදී එකි විනය නියෝගය A 5 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත. එකී විනය නියෝගයේ සඳහන් පරිදි ඉල්ලුම්කාරියට ලැබී ඇති චෝදනා පත්‍රයෙහි I සිට XIX දක්වා චෝදනා සඳහන්ව ඇති අතර විධිමත් විනය පරීක්ෂණයට පසුව එකී චෝදනා වලින් I, X, XI, XV, XVIII, XIX යන චෝදනාවලට පමණක් ඉල්ලුම්කාරිය වැරදිකරු බවට ඒක පුද්ගල විනිශ්චය සභාව තීරණය කර ඇත. මේ අනුව විධිමත් විනය පරීක්ෂණයක් මඟින් ඉල්ලුම්කාරියට ලබා දී ඇති චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් 13 කට නිවැරදිකරු කර චෝදනා හයකට පමණක් වැරදිකරු කර ඇත. මේ අනුව ඉල්ලුම්කාරියට දඬුවම් පැමිණවීමට පෙර විධිමත් විනය පරීක්ෂණයක් සිදුකරමින් වග උත්තරකරු විසින් නීත්‍යානුකූල ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව පෙනේ. එමෙන්ම ඉල්ලුම්කාරියගෙන් වග උත්තරකාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්ණ විමසීමේදී අනාවරණය වී ඇත්තේ විනය පරීක්ෂණයේදී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට බාධාවක් නොවූ බවයි.

*ප්‍රශ්නය* : මහත්මිය මෙම විනය පරීක්ෂණයේ චෝදක පක්ෂය විදියට ඔබට නිදහසට කරුණු ඉදිරිපත් කරන්න තියෙන සියලුම අවස්ථා පාවිච්චි කළාද?

*උත්තරය* : ඔව්.

ප්‍රශ්නය : උත්තරය : නැහැ. ඒ සඳහා කිසිම බාධාවක් ඇති කලේ නැහැ නේද?

*උත්තරය* : නැහැ.

*ප්‍රශ්නය* : ඒ හැර වෙනත් බලපෑමක් මේ විනය පරීක්ෂණය සඳහා සිදුවුනේ නැහැ නේද?

*උත්තරය* : ප්‍රධාන සාක්ෂිකරුවන්ගේ සහභාගීත්වය ලබා ගැනීමට බැරි වුනා. විශේෂයෙන් රසිකා හපුතන්ත්‍රී මහත්මිය, ඊට පස්සේ මිරිහාන පොලිසියෙන් කැඳෙව්වේ ඊට පස්සේ කාලෙක සේවය කළ නිලධාරින්, ලංකා බැංකුවෙන් ගෙන්වූයෙන් මෑතකදී සේවයට ගත් නිලධාරීන්, වශයෙන් ඉල්ලුම්කාරිය හරස් ප්‍රශ්නවලට පිළිතුරු දී ඇත. මේ අනුව ඉල්ලුම්කාරියට විනය පරීක්ෂණයේදී බාධාවක් නොවුවද වැදගත් සාක්ෂි එකී පරීක්ෂණය සඳහා යොමුකරවීම සිදු නොවූ බව ඇයගෙන් සාක්ෂි විමසීමේදී හෙළිදරව් විය. එය ඉල්ලුම්කාරියට යම් අවාසි සහගත තත්වයක් බව නිගමනය කරමි.

(3) මීළඟට විමසා බැලිය යුතු කරුණ වන්නේ විනය පරීක්ෂණයෙන් අනතුරුව ඉල්ලුම්කාරියට පනවා ඇති විනය දඬුවම් කොතෙක් දුරට සාධාරණද යන්න වේ.

එකී විනය පරීක්ෂණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි විනය බලධාරියා විසින් පැනවූ දඬුවම් A 5 ලේඛනයේ පහත පරිදි සඳහන් කර ඇත.

(i) ඉල්ලුම්කාරිය විසින් සිදුකර ඇති බරපතල විෂමාචාර හේතුවෙන් කාර්යාංශයට රු. 800,000.00 පාඩුවක් සිදුව ඇති බවත් එයින් 600,000.00 ක් ඉල්ලුම්කාරියගේ වැටුපෙන් වාරිකය රු. 5000.00 බැගින් අඩුකරන බව.

(ii) වැඩ තහනම් කළ කාලයට වැටුප් හෝ දීමනා නොගෙවන බව,

(iii) වැටුප් වර්ධක දෙකක් විලම්භනය කරන බව,

(iv) ඉදිරිකාලයේදී මුදල් අංශයේ සේවයේ නොයොදන බව

මෙකී දඬුවම් වලින් සිව්වැනි දඬුවම සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිය හබ කිරිමක් නොකරයි.

2016.12.06 විනය නියෝගය ලබාදීමේදී 2013.03.27 චෝදනාපත්‍රය මඟින් ඉල්ලුම්කාරියට සිදුකර ඇති චෝදනාවලින් 13 ක් ඉවත් කර ඇත. ඒ අනුව ඉල්ලුම්කාරිය හබ කිරීමක් සිදු කරන්නේ ඉවත් නොකළ ඉතිරි චෝදනා 6 සම්බන්ධයෙන් සහ ඒ මත පනවා ඇති දඬුවම් සම්බන්ධයෙනි. ඉල්ලුම්කාරියට ලබාදී ඇති චෝදනා පත්‍රය A3 වශයෙන් ගොණුකර ඇති අතර එහි ඉල්ලුම්කාරිය නිදහස් නොකළ චෝදනා වන්නේ :

(I) ඉල්ලුම්කාරිය විසින් භාරගෙන තිබූ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලංකා බැංකුව ආයතනික ශාඛා අංක 1650 දරන ගිණුමට අයත් අංක 239481 සහ අංක 239482 දරන චෙක්පත් දෙක අස්ථානගත කිරීමෙන් වංචනිකව හා/හෝ නොසලිකිලිමත්ව හා/හෝ අනවධානයෙන් කටයුතු කිරීම,

(X) ඉල්ලුම්කාරිය විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මුදල් අංශයට අනුයුක්තව සේවය කරමින් සිටියදී ඉහත සඳහන් කළ 1650 ගිණුමට අයත් අංක 239483 සහ අංක 239484 දරන චෙක්පත් අස්ථානගත කිරීමෙන් හා/හෝ නැති කිරීමෙන් හිතාමතා ඉවත්කිරීමෙන් අනවධානයෙන් කටයුතු කිරීම වේ.

මීට අමතරව අංක : XV, XVIII, XIX යන චෝදනා වලින් කියැවෙන්නේ පිළිවෙලින් එසේ කිරීමෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඉල්ලුම්කාරිය කෙරේ තිබූ විශ්වාසය කඩකිරීම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අපකීර්තියට පත්කිරීම, ඉල්ලුම්කාරිය දරූ තනතුරත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් අපකීර්තියට පත් කිරීම වේ. ඉල්ලුම්කාරියට ඉහතකී දඬුවම් පැමිණවීමට පදනම්ව ඇත්තේ එකී චෝදනාවන් වේ.

මෙහිදී එකී අස්ථානගත වූ චෙක්පත් ඉල්ලුම්කාරිය භාරයේ තිබුණේද යන්න පළමුවෙන් අවධානය කළ යුතු කරුණ වේ. ඉල්ලුම්කාරියගේ පැමිණිල්ල මත මෙම නඩුවේ සාක්ෂි විමසීම ආරම්භ කළ අතර ඉල්ලුම්කාරියගෙන් මූලික සාක්ෂි ලබාගැනීමෙන් පසු 2019.01.07 වැනි දින ඉල්ලුම්කාරියගෙන් අස්ථානගත වූ චෙක්පත් දෙක ගැන වග උත්තරකරු විසින් හරස් ප්‍රශ්න විමසා ඇත. එහිදී,

*ප්‍රශ්නය* : ඉල්ලුම්කාරිය මේ අංක දෙක ඇතුළත් චෙක්පොත කාගේ භාරයේද තිබුණේ ?

*උත්තරය* : චෙක්රෝල මා භාරයේ තිබුණේ. අවශ්‍ය රාජකාරි කරන්න ලබාගත් චෙක් බන්ඩලයකින් ලබාගත්ත චෙක්පත් දෙකක්.

*ප්‍රශ්නය* : මේ අංක දෙක ඇතුළත් චෙක්පොත සාක්ෂිකාරියගේ භාරයේ තිබුණේ ?

*උත්තරය* : ඔව්.

*ප්‍රශ්නය* : සාක්ෂිකාරිය දන්නවද එම චෙක්පත් දෙක මුදල් බවට පත්කරලා රු. 800000 ක මුදලක් කාර්යාංශයෙන් ලබාගෙන තිබෙන බව.

*උත්තරය* : ඔව්

*ප්‍රශ්නය* : සාක්ෂිකාරියට කොහොමද ඒක දැනගන්න ලැබුණේ ?

*උත්තරය* : රිකන්සිලේසන් චෙක් කරන කොට ඒ අදාළ චෙක්පතට සම්බන්ධ වවුචරය සොයලා දෙන්න කියලා යටවර මහත්මිය මට දන්වපු අවස්ථාවේදී.

මේ අනුව චෙක්රෝල තමා භාරයේ තිබූ බව ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී තහවුරු වී ඇත. ඇය එලෙස චෙක්පත් රෝලක් භාරව සිටියේ නම් එය ආරක්ෂාකර ගැනීමේ වගකීම මෙන්ම ඒ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කිරීමේ වගකීම ඇයට පැවරේ. කෙසේ වුවද එසේ තිබියදී චෙක්පත අස්ථාන ගතවීමෙන් පළමු චෝදනාවේ සඳහන් පරිදි අස්ථානගතවීමෙන් ඇතිවන හානිය සම්බන්ධ වගකීම ඉල්ලුම්කාරියට පැවරේ. එමෙන්ම ඇය එකී චෙක්රෝල ආරක්ෂාකිරීමට නිසි අවධානයෙන් කටයුතු නොකිරීම යන චෝදනාවද තහවුරු වේ. තවද ඇය එකී චෙක්රෝලෙහි අඩංගු චෙක්පත් දෙකක් අස්ථානගතවීම දැන සිට ඇත්තේද එකී චෙක්පත්වලට අදළ වවුචර්පත් නොමැතිවීම මත එය සොයාදෙන මෙන් වෙනත් නිලධාරිනියක් ඉල්ලා සිටීමේදී ය. ඉල්ලුම්කාරිය තමා භාරයේ පැවතී චෙක්පත් අස්ථානගතවීම තමන් විසින්ම අනාවරණය කරගෙන නොමැත. ඒ අනුව, තමන් වෙත තිබූ චෙක්පත් ප්‍රමාණය ගැන එදිනෙදා සැලකිලිමත්ව කටයුතු කල යුතුව ඇතත් ඒ පිළිබඳව ඉල්ලුම්කාරියගේ අවධානයක් යොමුව නොමැති බව තහවුරු වේ. තවද චෙක්පත් අස්ථානගතවීම සම්බන්ධයෙන් වෙනත් නිලධාරිනියක් විමසන තුරු ඉල්ලුම්කාරිය දැනුවත්ව නොසිටීමෙන් ම ඇය පළමු සහ දහවැනි චෝදනාවල සඳහන් පරිදි අනවධානව සහ නොසැලකිල්ලෙන් කටයුතු කළ බව තහවුරු වේ.

කෙසේ වුවද ඉල්ලුම්කාරියගෙන් 2018.12.26 වැනි දින මූලික ප්‍රශ්න විමසීම කරන අවස්ථාවේදී චෙක්රෝල තමන් භාරයේ තිබුණද එකී චෙක්රෝල අස්ථානගත වීමේ වගකීම තමන් භාර නොගන්නා බව ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර ඇත.

මේ පිළිබඳව ඇයගෙන් නැවත ප්‍රශ්න විමසීමේදී එයට හේතු ඇය විසින් ප්‍රකාශ කර ඇත.

*ප්‍රශ්නය* : දැන් තමුන් කීවා චෙක්රෝලෙන් චෙක්පත් අස්ථාන ගතවීමේ වගකීම තමුන් භාර ගන්නේ නැහැ කියලා?

*උත්තරය* : ඔව්

*ප්‍රශ්නය* : ඇයි එහෙම භාර ගන්නේ නැහැ කියන්නේ ?

*උත්තරය* : ඒකට හේතු කිහිපයක් තිබෙනවා. මා සමඟ මගේ සහායට සිටි නිලධාරීන්ට මගේ මේස ලාච්චුවේ යතුර භාවිතා කිරීමට ඉඩකඩ සලසා දී තිබුණා. ඒ කළමනාකාරිනි (මුදල්) රසිකා හපුතන්ත්‍රී මහත්මියගේ උපදෙස් පරිදි. ඒ වගේම නිලධාරින් මා නිවාඩු අවස්ථාවලත් චෙක්පත් මුද්‍රණය කර ලබාදී තිබුණා. රක්ෂණ වන්දි ලාභියෙක් පැමිණියොත් මම නැති වුනත් හදිසි අවස්ථාවල චෙක්පත් මුද්‍රණය කරදී තිබුණා යනාදී වශයෙන් හේතු දක්වා ඇත. මේ අනුව වෙනත් නිලධාරින් විසින්ද චෙක්පත් භාවිතා කිරීමත් එයට ඉහල කළමනාකාරිත්වය ඉඩදීමත් යන කරුණු අනාවරණය වීමෙන් පෙනී යන්නේ ඉල්ලුම්කාරියට පමණක් ස්වාධීනව චෙක්පත් භාවිතය ආයතනය විසින් පවරා නොමැති බවයි. එමෙන්ම එකී කටයුතු සඳහා තවත් නිලධාරීන් මැදිහත් කරවීම ඉහල කළමනාකරිත්වය විසින් සිදුකර ඇති බැවින් එය ඉල්ලුම්කාරියගේ පාලනයෙන් බැහැරවයාමක් ලෙසද සැලකිය හැක. තවද මෙම සිද්ධියට අදළ විනය පරීක්ෂණයේ දී ද මෙම චෙක්පත් පරිහරණය කළ අනෙකුත් නිලධාරින් වන කළමනාකර (මුදල්) සහ ඉල්ලුම්කාරියට සහාය දැක්වීමට කලමනාකාර මුදල් විසින් යොදවා සිටි අනෙකුත් නිලධාරින්ගේ සාක්ෂි ලබාගැනීමට වග උත්තරකාර පාර්ශවය අසමත්ව ඇත. මේ අනුව චෙක්පත් අස්ථාන ගතවීමෙන් සිදුවූ අලාභය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ඉල්ලුම්කාරිය වෙත පැවරීම සාධාරණ නොවන බව නිගමනය කරමි.

මේ හැර වග උත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති XI ලේඛනය හෙවත් එම්. ඩී. නිශාන්ති මහත්මියට එරෙහි විධිමත් විනය පරීක්ෂණයේ ඒක පුද්ගල විනිශ්චය සභාවේ අවසන් වාර්තාවේ පරීක්ෂණ නිලධාරියා විසින් පොදු නිරීක්ෂණ ලෙස දක්වා ඇති කොටසට අනුවද ඉල්ලුම්කාරියගේ සහායට යොදවාගත්තේ යයි කියන පොදු සහකාර ලේල්වල ගමගේ අනිල් නිස්සංක යන අය අවිධිමත්ව සේවයට බඳවා ගත් අයෙකු බවටත් ඔහු සේවයට පැමිණීමට පෙර මුදල් වංචාවන් සිදුකර ඇති අයෙකු බවටත් සාක්ෂිකරුවන් විසින් සාක්ෂි දී ඇති බව අනාවරණය වේ. කෙසේ වුවද මෙම තැනැත්තා සාක්ෂිකරුවකු වශයෙන් නම් කර නොමැති බවටද තවදුරටත් කරුණු අනාවරණය වී ඇත. තවද මෙකී වාර්තාවට අනුව තවදුරටත් හෙළිදරව් වී ඇති කරුණු වන්නේ මුදල් අංශයේ කළමනාකාරියගේ සාක්ෂිය මේ සම්බන්ධයෙන් වැදගත් වුවත් ඇය කැඳවා ගැනීමට වග උත්තරකාර පාර්ශ්වය අසමත්ව ඇති බවයි. තවද මෙම ගැටළු සහගත අවස්ථාවේ ඇයගේ ඉල්ලා අස්වීම භාරගැනීමද විධිමත් පරිපාලනයට පටහැනි බවටද පරීක්ෂණ නිලධාරියා කරුණු දක්වා ඇත.

මේ හැර චෙක්පත් තබා ගැනීම වෙනත් ලිපිද්‍රව්‍ය සමඟ එකට පවත්වා ගැනීම, එහි යතුර ඕනෑම අයෙකුට භාවිතා කිරීමේ හැකියාව යනාදී කරුණු තුළින්ද මුදල් අංශයේ පරිපාලන දුර්වලතා පැවති බවටද එකී ලේඛනය මගින් කරුණු දක්වා ඇත. තවද මුදල් අංශයේ අධීක්ෂණ දුර්වලතා මෙන්ම චෙක්පත් තබා ගැනීමේදී පැවති අනාරක්ෂිතව බවද මෙම වාර්තාව මගින් වැඩිදුරටත් හෙළිදරව් කර ඇත. එකී කරුණු අනුව මෙම නඩුවේ ඉල්ලුම්කාරියගේ නොසැලකිල්ල, අනවධානය මෙන්ම මුදල් අංශයේ කටයුතු කරන අනෙකුත් නිලධාරීන්ගේ සහායක නොසැලකිල්ලද ආයතනයේ චෙක්පත් අස්ථාන ගතවීමට හේතුවී ඇති බව පෙනේ. තවද ඉල්ලුම්කාරියට මුදල් අංශයේ රාජකාරි කටයුතු පැවරීම ලිඛිතව සිදු නොකළ බවද වග උත්තරකාර පාර්ශවයේ සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද හෙළිදරව් වී ඇත. තවද ඉල්ලුම්කාරියගේ සහායට පත්කර ඇති නිලධාරියාගේ පත්වීම නීත්‍යානුකූල නොවන බවත්, එකී පත්වීම කළමනාකාර (මුදල්) යන අයගේ අභිමතය පරිදි විසින් සිදුකර ඇති බවටත් එකී පුද්ගලයාටද ඉල්ලුම්කාරියගේ කටයුතු පවරා ඇති බවටත් කරුණු අනාවරණය වී ඇත. මේ අනුව පෙනී යන්නේ ආයතනයේ මුදල් අංශයේ අධීක්ෂණ මෙන්ම පරිපාලනයේද, නොයෙකුත් දුර්වලතා පැවතීම මෙම සිද්ධියට අනුබලයක් මෙන්ම පිටුවහලක් වී ඇති බවයි.

තවද හිස් චෙක්පත් භාරව සිටීම ඉල්ලුම්කාරිය විසින් සිදුකළද, මුද්‍රණය සඳහා ඒවා ලබාගැනීමට කළමනාකාර මුදල් විසින් වෙනත් අයට ඉඩදී තිබූ බව ඉල්ලුම්කාරියගේ සාක්ෂියෙන් තහවුරු වේ.

මේ හැර ද චෙක්පත් සඳහා වවුචර්පත් සැකසීම මුදල් අංශයෙන් සිදුකරන බවද, එකී වවුචර් අනුමත වූ පසු පරිඝනක ආශ්‍රයෙන් චෙක්පත් මුද්‍රණය කෙරෙන බවද, ඉන්පසු චෙක්පත් අත්සන් කිරීම බැංකුව වෙත අත්සන් නිර්දේශ කර යවා ඇති බලයලත් නිලධාරීන් දෙදෙනකු විසින් අත්සන් යෙදූ පසු චෙක්පත් මුදල් කරගත හැකි බවටද ඉල්ලුම්කාරිය සිය සාක්ෂිය මගින් කරුණු දක්වා ඇත.

*ප්‍රශ්නය* : එතකොට මේ වවුචර්පත පිළියෙල කරන්නේ කොහෙද ?

*උත්තරය* : වවුචර් එක මුදල් අංශයෙන්

*ප්‍රශ්නය* : වවුචර් එක සකස්වෙලා අනුමත වුනාට පස්සේ චෙක්පත ලියන්නේ කවුද?

*උත්තරය* : එය පරිගණක ආශ්‍රයෙන් මුද්‍රණය කරනවා.

*ප්‍රශ්නය* : මොකක්ද අංශය ?

*උත්තරය* : මුදල් අංශය

*ප්‍රශ්නය* : මේ චෙක්පත් මුදල් බවට පරිවර්තනය වන්න කී දෙනෙක් අත්සන් කරන්න ඕනද ?

*උත්තරය* : 2 අත්සන් කරන්න ඕනෑ.

මේ අනුව චෙක්පතක් මුදලක් බවට පරිවර්තනය වීම නිලධාරීන් කිහිප දෙනෙකුගේ කාර්යභාරය මත සිදුවන බව ඉහත සාක්ෂිය මගින් අනාවරණය වේ. එසේ වුවද එකී කාර්යයන්ට අදාළ පුද්ගලයන් කවුරුන් ද යන්න අනාවරණය කර ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව කටයුතු කිරීමට වග උත්තරකාර පාර්ශ්වය අපොහොසත්ව ඇති බව ඉල්ලුම්කාරියගේ සාක්ෂි මත වැඩිදුරටත් තහවුරු වේ.

*ප්‍රශ්නය* : වවුචර්පත් සකස් කළ චෙක්පත් නිකුත් කළ නිලධාරීන්ට චෝදනා පත්‍ර නිකුත් කළා ද,

*උත්තරය* : නැහැ

ඒ අනුව එකී චෙක්පත අස්ථානගත වීමේ සම්පූර්ණ වගකීම ඉල්ලුම්කාරියට පමණක් පැවරීම සාධාරණ නොවන බව නිගමනය කරමි.

4. මීළඟට සලකා බැලිය යුතු කරුණ වන්නේ වැඩ තහනම් කළ කාලයට වැටුප් හෝ දීමනා නොගෙවන බවට ලබාදී ඇති දඬුවම සාධාරණද යන්න වේ.

මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පාර්ශ්වය සිය මූලික ප්‍රකාශය තුළින් දක්වා ඇත්තේ ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කිරීම අසාමාන්‍ය කාලයක් තුළ සිදුකිරීම වග උත්තරකරුගේ ක්‍රියා කලාපය මත සිදුව ඇති බැවින් ඉල්ලුම්කාරියට සියලු දීමනා සහිත වැටුප් ලබා ගැනීමට හිමිකම් ඇති බවයි. ඉහල අධිකරණ තීරණයක ප්‍රතිපාදන ගෙනහැර දක්වමින් ඉල්ලුම්කාරියට එලෙස වැටුප් ලබාගැනීමට අයිතිය ඇති බවට ඉල්ලුම්කාරිය සිය පළමු ප්‍රකාශය තුළින් කරුණු දක්වා ඇත. මීට අමතරව ඉල්ලුම්කාරියගෙන් 2018.12.06 වැනි දින මූලික සාක්ෂි විමසීමේදී ද මේ පිළිබඳව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත්තේ කාර්යාලයට අයත් චෙක්පත් දෙකකින් වංචනික ලෙස මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් 2009.10.21 වැනි දින තමන්ගේ වැඩ තහනම් කිරීමක් සිදුකර ඇති බවත්, 2009.10.19 වැනි මූලික පරීක්ෂණයක් සඳහා තමාගෙන් ප්‍රකාශ ලබාගැනීමෙන් පසු මෙලෙස වැඩ තහනම් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. තවද වැඩ තහනම් කිරීමෙන් වසර හතරකට පමණ පසු චෝදනා පත්‍රය ලැබී ඇති බව ද ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේ දී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

*ප්‍රශ්නය* : ඔබගේ වැඩ තහනම් කලේ 2009 ඔක්තෝබර් මාසේ නම් චෝදනා පත්‍රය ලැබෙන්නේ වසර කීයකට පස්සේ ද?

*උත්තරය* : වසර හතරකට ආසන්න කාලයක දී

මේ අනුව විනය පරීක්ෂණය සහ නියෝගය ලබාදීමට ප්‍රමාදයක් ඇතිව ඇති බව ඉල්ලුම්කාරියගේ සාක්ෂියෙන් හෙළිවේ. මේ හැර එකී ප්‍රමාදය ගැන වග උත්තරකාර පාර්ශ්වය විසින් 2019.01.07 වැනි දින හරස් ප්‍රශ්න විමසීමේදී ද ඉල්ලුම්කාරිය විසින් කරුණු දක්වා ඇත.

*ප්‍රශ්නය* : ඊළඟට විධිමත් විනය පරීක්ෂණය කිසිම බාධාවකින් තොරව පවත්වාගෙන ගියා නේද?

*උත්තරය* : කාලය සෑහෙන්න ගත වුණා . . . . . ඔයවගේ කල්ගත වෙමින් 2013 නිකුත් කරපු චෝදනා පත්‍රය 2016 වෙනකල්ම කල්ගත වීමක් වුනා. වශයෙන් ඉල්ලුම්කාරිය සිදුවූ ප්‍රමාදය ගැන කරුණු දක්වා ඇත. අවසාන වශයෙන් ඇය ඉල්ලා සිටින්නේ වැඩ තහනම් කරන ලද කාලයට නොගෙවන ලද හිඟ මුදල් ලබාදෙන ලෙසත් ය.

ඉහත කී පරිදි ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදුකිරීමට ප්‍රමාද වූ බව 2009.04.03 දින වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී හෙළිදරව් වී ඇත.

*ප්‍රශ්නය* : දැන් තමුන්ට කියන්න පුලුවන් ද මේ ඉල්ලුම්කාරියගේ වැටුප් රහිතව සේවය අත්හිටෙව්වේ කවද්ද කියලා?

*උත්තරය* : ස්වාමිනී 2009 ඔක්තෝබර් 21 වැනි දින සේවය අත්හිටෙව්වේ ?

*ප්‍රශ්නය* : වැඩ තහනම් කරලා කොච්චර කාලෙකට පස්සෙද A 5 කියන චෝදනා පත්‍රය ඉල්ලුම්කාරියට නිකුත් කරන්නේ ?

*උත්තරය* : ස්වාමිනි චෝදනා පත්‍රය නිකුත් කිරීමට වසර 3 1/2 ක් ගතවෙලා තියෙනවා.

ඒ අනුව වග උත්තරකාර පාර්ශ්වය ද වැඩ තහනම් කර චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට වසර 3 1/2 ක කාලයක් ගතවූ බව පිළිගෙන ඇත. මේ හැර එකී කාලය ගතවීම වග උත්තරකරුගෙන් සිදුවූ ප්‍රමාදය මත සිදුවූ බව වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

*ප්‍රශ්නය* : ආයතන සංග්‍රහයේ කොහෙද සඳහන් වන්නේ චූදිත නිලධාරියකුගේ වැඩ තහනම් කරලා අවුරුදු 3 1/2 කට පස්සේ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමේ හැකියාවක් තියනවා කියලා?

*උත්තරය* : මගේ දැනුමේ හැටියට එහෙම නැහැ. මේ ප්‍රමාද වීම නිසා අපි ඇයට අඩු වැටුප් ගෙවන්න තීරණය කළා. ඒ වගේම නැවත සේවයේ පිහිටුවන්න කටයුතු කළා.

*ප්‍රශ්නය* : එහෙම කරන්න පාදක වුනේ මේ ඉල්ලුම්කාරිය දිගින් දිගටම තමුන්ලාගේ කාර්යාංශයට ඉදිරිපත් කල තමාගේ වැඩ තහනම් කිරීම නීති විරෝධී බවට කළ ඉල්ලීම අනුව නේද?

*උත්තරය* : ස්වාමිනී ඇය ඉදිරිපත් කරලා තියෙනවා. ඒකත් සලකා බලා අපේ ප්‍රමාදයත් සලකා බලා තමා අපි එහෙම පියවර අරන් තිබෙන්නේ.

*ප්‍රශ්නය* : ඒ ප්‍රමාදය ගැන වග කියන්න ඕන කවු ද ?

*උත්තරය* : ස්වාමිනි ප්‍රමාදය ගැන ආයතනය වග කියන්න ඕනි.

මේ අනුව වග උත්තරකාර පාර්ශ්වය විසින් විනය පරීෂණයක් සිදුකර චෝදනා පත්‍රයක් ලබාදීමට ප්‍රමාදයක් සිදුවූ බවත්, ඒ පිළිබඳව වග උත්තරකාර පාර්ශ්වය වග කිවයුතු බවත් පිළිගෙන ඇත.

ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව බව දෙපාර්ශ්වයම පිළිගෙන ඇත. ආයතන සංග්‍රහයේ 48 වැනි පරිච්ඡේදයේ 22 වගන්තිය යටතේ විනය බලධාරියාගේ කාර්‍යභාරය දක්වා ඇත. එහි 22:1 වගන්තියට අනුව දක්වා ඇත්තේ විනය පරීක්ෂණය ප්‍රමාදවන බව පෙනී යන්නේ නම් ප්‍රමාදය වැලක්වීමට නිසි පියවර ගැනීම විනය බලධාරියාගේ වගකීම බවයි. තව ද 22:4 වගන්තිය යටතේ දක්වා ඇත්තේ විනය බලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාව සුපරීක්ෂාකාරී ලෙස අධ්‍යයනය කර අප්‍රමාදව තම විනය නියෝගය නිකුත් කිරීම විනය බලධරයකුගේ වගකීම වන්නේය යනුවෙනි. මෙහි දී ''යුක්තිය පසිඳලීමට ප්‍රමාද කිරීම යුක්තිය ඉටු නොකිරීමක් වන්නේ ය'' යන ආප්තය විනය බලධාරියා විසින් සැලකිල්ලට ගතයුතු බවද දක්වා ඇත. මේ අනුව මෙම නඩුවට අදළ විනය පරීක්ෂණය සිදුකිරීම විනය නියෝගය ලබාදීම යන කාර්‍යයන්හි දී වග උත්තරකාර පාර්ශ්වයේ ප්‍රමාදය නිසා ඉල්ලුම්කාරියට කිසිදු වැටුපක් නොමැතිව සේවය අහිමිව සිටීමෙන් සහ යුක්තිය ඉටුකිරීම ප්‍රමාද වීමෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුව ඇතිබව නිගමනය කරමි.

5. ආයතන සංග්‍රහයේ XLVII හි 24:03:10 යටතේ ඉල්ලුම්කාරියගේ වැටුප් වර්ධක දෙකක් විලම්බනය කිරීමට වග උත්තරකරු විසින් කටයුතු කර ඇති බව ඉල්ලුම්කාරියගේ සාක්ෂියේ දී හෙළිදරව් වී ඇති අතර එය අසාධාරණ බව ඉල්ලුම්කාරිය විසින් ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කාරියට ඉහත දඬුවම් පමුණුවා ඇත්තේ විධිමත් විනය පරීක්ෂණයකින් පසුව ඇයට ලබාදී ඇති චෝදනා පත්‍රයක් අනුවය. එහි පළමුවන චෝදනාව අනුව ඉල්ලුම්කාරිය විසින් භාරගෙන ඇය භාරයේ තිබූ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් චෙක්පත් ආරක්ෂිතව තබා නොගැනීමෙන් ඉල්ලුම්කාරිය අනවධානයෙන් සහ නොසැලකිල්ලෙන් කටයුතු කිරීම හේතුවෙන් ඇය වරදකරු වී ඇත. තව ද එකී චෝදනා පත්‍රයේ දහවැනි සහ එකොළොස්වැනි චෝදනාවන් අනුව ද ඉල්ලුම්කාරියට භාර දී ඇති චෙක්පත් සම්බන්ධයෙන් ඇය නිසි අවධානයෙන් කටයුතු නොකළ බැවින් එකී චෙක්පත් අස්ථානගත වීම සිදුවී ඇති හෙයින් එකී චෝදනාවලට ඉල්ලුම්කාරිය වරදකරු කර ඇත. වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුවකුගෙන් සාක්ෂි විමසීම 2019.02.28 දින සිදු කර ඇති අතර එහිදී ඉල්ලුම්කාරිය වෙත අස්ථානගත වූ චෙක්පත් ලබාදී ඇති බව හෙළිකර ඇත.

*ප්‍රශ්නය* : මහත්මයාට කියන්න පුලුවන් ද ඉල්ලුම්කාරියට ඉදිරිපත් කළ චෝදනා පත්‍රයේ අංක 02ට ඇතුළත් චෙක්පත් 02 ඇතුළත් චෙක්රෝල ඉල්ලුම්කාරියට ලබාදීමක් සිදුකරලා තිබෙනවා ද ?

*උත්තරය* : මා ළඟ තිබෙන ගොනුව අනුව භාර දීලා තිබෙනවා. මේ හැර එකී චෙක්පත්වලින් ලක්ෂ අටක මුදලක් අස්ථානගතව ඇති බවත් ඉල්ලුම්කාරිය නිසි අවධානයෙන් කටයුතු කලේ නම් ආයතනය ට එකී පාඩුව සිදු නොවන බවටත් සාක්ෂි ලබා දී ඇත.

මේ හැර 2019.01.07 දින ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න විමසීමේදීද සිද්ධියට අදළ චෙක්පත් තමා භාරයේ තිබූ බව ඉල්ලුම්කාරිය පිළිගෙන ඇත.

*ප්‍රශ්නය* : ඒ කියන්නේ මේ අංක 02 ඇතුලත් චෙක්පොත කාගේ භාරයේ ද තිබුනේ?

*උත්තරය* : චෙක්රෝල මා භාරයේ තිබුණේ. අවශ්‍ය රාජකාරි කරන්න චෙක් බන්ඩලයකින් ලබාගත්ත චෙක්පත් දෙකක්.

මේ අනුව ඉල්ලුම්කාරිය චෙක්පත් භාරගත්බව තහවුරුවන අතර ඒවා පරිහරණයේ දී ඇය වගකීමෙන් මෙන්ම නිසි අවධානයෙන් කටයුතු කල යුතුව ඇත. එලෙස තමන් භාරගත් චෙක්පත් පිළිබඳව අවධානයෙන් සහ නිසි සැලකිල්ලෙන් කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ඉල්ලුම්කාරියට ආයතන සංග්‍රහයේ 48 වන පරිච්ඡේදයේ 24:3:10 හි ප්‍රතිපාදන පරිදි දඬුවමක් වශයෙන් වැටුප් වර්ධක දෙකක් අහිමි කිරීමක් සිදුව ඇති බව නිගමනය කරමි.

<u>ප්‍රදානය</u>

මෙහි පළමු සහ දෙවන පාර්ශ්වයේ ප්‍රකාශයන් මෙන්ම දෙපාර්ශ්වයම ඉදිරිපත් කර ඇති සාක්ෂි සියල්ල සැලකිල්ලට ගෙන ඉහත 1 සිට 5 දක්වා සාක්ෂි විශ්ලේෂණය තුළින් එළැඹුණු නිගමනයන්ද අදාළ කරගෙන පහත ප්‍රදානයන් කරමි.

2016.12.06 විනය නියෝගය ලබාදීමේ දී ඉල්ලුම්කාරියට දඬුවම් හතරක් පනවා ඇති අතර ඉල්ලුම්කාරිය හතරවන දඬුවම සම්බන්ධයෙන් හබ කිරීමක් නොකරයි. ඒ අනුව ලබා දී ඇති අනෙකුත් දඬුවම් සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කරන ලදී.

1. විනය නියෝගය අනුව පළමුවන දඬුවම වන්නේ ඉල්ලුම්කාරිය විසින් සිදුකර ඇති බරපතල විෂමාචාර හේතුවෙන් කාර්යාංශයට රු. 800,000 ක පාඩුවක් සිදුව ඇති බවත් එයින් රු. 600,000 ක් ඉල්ලුම්කාරියගේ වැටුපෙන් වාරිකය රු. 5,000 බැගින් අඩුකරන බවය. මෙම කරුණ සම්බන්ධයෙන් දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීම් සහ වාචික සාක්ෂි සලකා බැලීමේ දී චෙක්පත ඉල්ලුම්කාරිය භාරයේ තිබුණ ද එය මුදල් බවට පරිවර්තනය කිරීම දක්වා වවුචර්පත් සකස් කිරීම, චෙක්පත් මුද්‍රණය, ගෙවීම් අනුමත කිරීම, චෙක්පත් අත්සන් කිරීම වැනි කටයුතු පුද්ගලයින් කිහිපදෙනෙකුට පැවරී ඇතිබව පෙනී යන අතර එය සාමූහික ක්‍රියාවලියක් මෙන්ම සාමූහික වගකීමක් ද බව පෙනේ. එමෙන්ම ඉහත කී පාඩුව සම්බන්ධයෙන් ඉල්ලුම්කාරියගේ අනවධානය සහ නොසැලකිල්ල මෙන්ම ඉහතින් ද දැක්වූ පරිදි ආයතනයේ පරිපාලන දුර්වලතා ද, ඉහල නිලධාරීන්ගේ අධීක්ෂණ දුර්වලතාද බලපා ඇති බව එකී සාක්ෂි විමර්ශනයේ දී පෙනී යයි. ඒ අනුව සිදුවූ අලාභය සම්පූර්ණයෙන්ම මෙම ඉල්ලුම්කාරිය වෙත පැවරීම සාධාරණ නොවන බව නිගමනය කරමි. ඒ අනුව සිදුව ඇති පාඩුව වන රු. 800,000 මුදලින් 40% ක් පමණක් එනම් රුපියල් තුන් ලක්ෂ විසිදහසක් (රු.320,000) ක් පමණක් ඉල්ලුම්කාරියගේ වැටුපෙන් අය කිරීමට කටයුතු කරන මෙන් වග උත්තරකරුට නියෝග කරමි. දැනට ඊට වඩා වැඩි මුදලක් අයකරගෙන ඇත්නම් එය ආපසු ඉල්ලුම්කාරිය වෙත ගෙවන මෙන්ද වැඩි දුරටත් නියෝග කරමි.

2. විනය නියෝගය අනුව දෙවන දඬුවම වන්නේ ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කළ කාලයට වැටුප් හෝ දීමනා නොගෙවන බවයි. ඉල්ලුම්කාරියට ලබා දී ඇති චෝදනා පත්‍රය අනුව කාර්යාංශයට අයත් චෙක්පත් දෙකක් අස්ථානගත වීම සම්බන්ධයෙන් ඇයට චෝදනා සිදුකර ඇත. කෙසේවුවද මෙහි දී ඉල්ලුම්කාරිය මූල්‍ය වංචාවක් හෝ චෙක්පත් සොරකම් කිරීමක්, චෙක්පත් මගින් මුදල් ලබා ගැනීමක් සිදුකල බව විනය පරීක්ෂණයේ දී හෝ සාක්ෂි විමසීමේදී හෙළිදරව් වී නොමැත. එසේම විධිමත් විනය පරීක්ෂණයේ දී එකී චෝදනාවලින් ඉල්ලුම්කාරිය නිදහස් කර ඇත. විශේෂයෙන් වග උත්තරකරුගෙන් සාක්ෂි විමසීමේදීද අනාවරණය වී ඇත්තේ මෙම චෙක්පත් හුවමාරුකර මුදල් ලබාගත්තේ කවරෙක් ද යන්න මේ දක්වා අනාවරණය වී නොමැති බවයි. මේ අනුව චෙක්පත් අස්ථානගත වීම සහ එමගින් ලක්ෂ අටක මුදලක් ලබාගැනීම සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිය සෘජුවම වගකීමට යටත් වන බව තහවුරු නොවේ.

තව ද විනය පරීක්ෂණය සඳහා වසර තුන හමාරක පමණ කාලයක් ගතවූ බවත් එකී ප්‍රමාදය සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශවය වගකිවයුතු බවත් වග උත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගේ සාක්ෂියෙන් හෙළිදරව් කර ඇත. මේ අනුව විනය පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාදවීම ඉල්ලුම්කාරියගේ ප්‍රමාද දෝෂයක් නොව වග උත්තරකරුගේ ප්‍රමාදයන් නිසා සිදුව ඇති බැවින් වග උත්තරකරු විසින් එයට වගකිවයුතු බව පැහැදිලි වේ. ඒ අනුව එකී කල්පමාව සම්බන්ධ සම්පූර්ණ කාලය සඳහා ඉල්ලුම්කාරියට වැටුප් නොගෙවීම සාධාරණ නොවන බව තීරණය කරමි. කෙසේ වුවද ඉල්ලුම්කාරියගේද නොසැලකිල්ල සහ අනවධානය තුළින් මෙම චෙක්පත් අස්ථානගත වීමට ඉල්ලුම්කාරිය යම් ප්‍රමාණයකට වරදකරු වී ඇත. එබැවින් යම්කිසි සාධාරණ කාලයක් සඳහා ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කිරීම අසාධාරණ නොවන බව ද තීරණය කරමි. එකී කරුණු සියල්ල සලකා බලා ඉල්ලුම්කාරියගේ වැඩ තහනම් කර ඇති සම්පූර්ණ කාලයට අදළ නොගෙවා ඇති වැටුපෙන් 50% ප්‍රමාණය ඉල්ලුම්කාරියට ගෙවීමට නියෝග කරමි. ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ගොනුකර ඇති Y 1 ලේඛනයේ සංශෝධනයක් ලෙස 2019.09.16 දින සාක්ෂි විමසීමේදී ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් රු. 528,183.23 මුදලින් 50% වන මුදල එනම් රු. 264,091.62 ක මුදල ඉල්ලුම්කාරියට ගෙවීම පිණිස මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළවී මාස දෙකක් තුල නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස වග උත්තරකරුට නියෝග කරමි.

3. ඉහතින්ද සඳහන් කල පරිදි ඉල්ලුම්කාරියගේ අනවධානය සහ නොසැලකිල්ල මත චෙක්පත් අස්ථානගත වීම සිදුව ඇති බව විධිමත් විනය පරීක්ෂණය තුළින් මෙන්ම සාක්ෂි විමසීම තුළින් ද අනාවරණය වේ. එබැවින් එකී දඬුවම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රදනයක් නොකරමි. මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

**නීතිඥ එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2021 මැයි මස 15 වැනි දින දී ය.

11-600

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.